වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயலாற்றுகை அறிக்கை
Annual Performance Report

2024

ජනමාධ්‍ය අංශය
வெகுசன ஊடகப் பிரிவு
Mass Media Division



සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
சுகாதார மற்றும் வெகுசன ஊடக அமைச்சு
Ministry of Health and Mass Media

වාර්ෂික කාර්යසාධන වාර්තාව 2024

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

(ශීර්ෂය 105 : ජනමාධ්‍ය අමාත්‍යාංශය)

2020.01.30 දින රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලද ආකෘති පත්‍රය ප්‍රකාරව මෙම වාර්තාව සකස් කොට ඇත.

අන්තර්ගතය

		පිටුව
පරිච්ඡේදය 01 -	ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	01 - 12
පරිච්ඡේදය 02 -	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	13 - 30
පරිච්ඡේදය 03 -	වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය	31 - 38
පරිච්ඡේදය 04 -	කාර්ය සාධන දර්ශක	39 - 42
පරිච්ඡේදය 05 -	තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	43 - 48
පරිච්ඡේදය 06 -	මානව සම්පත් පැතිකඩ	49 - 56
පරිච්ඡේදය 07 -	අනුකූලතා වාර්තාව	57 - 65

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

1.3 ප්‍රධාන කාර්යයන්

1.4 සංවිධාන සටහන

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන / අරමුදල්

ඇ) ව්‍යාපෘතිය

ආ) දායක නියෝජිතායතනය

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම

ඈ) ව්‍යාපෘති කාල සීමාව

1.0 ජනමාධ්‍ය අමාත්‍යාංශය

1.1 හැඳින්වීම

හොඳින් දැනුම්වත්වූ, බහුමතික සහ සක්‍රිය සමාජයක් ගොඩනැගීම සඳහා නිදහස් මාධ්‍ය සම්ප්‍රදාය ප්‍රවර්ධනය කිරීම, මාධ්‍ය කර්මාන්තයේ දියුණුව සඳහා අවශ්‍ය මැදිහත්වීම සිදුකිරීම මෙන්ම දේශීය ජනවිඥානය ප්‍රගතිය කරා මෙහෙයවිය හැකි වගකීම් සහගත මාධ්‍ය භාවිතයක් සඳහා මාධ්‍ය කර්මාන්තය ධෛර්යමත් කිරීම සඳහා අවශ්‍ය දායකත්වය ජනමාධ්‍ය අමාත්‍යාංශය නිරතුරුවම ලබා දෙනු ලැබේ. ජනමාධ්‍ය ක්ෂේත්‍රය ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකවද සංවර්ධනය විය යුතු බව මෙම අමාත්‍යාංශය මැනවින් අවබෝධ කර ගෙන ඇත.

මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගමනය රැඳී ඇත්තේ සාම්ප්‍රදායික මාධ්‍ය කලාවෙන් ඔබ්බට විහිදුනු තොරතුරු මත පදනම් වූ නව මාධ්‍ය ගමනකිනි. සමාජ මාධ්‍ය ඇතුළු නව මාධ්‍ය භාවිතය පිළිබඳ දැනුම, අවබෝධය සහ සන්නිවේදන උපක්‍රම සමාජගත කිරීම සහ ඩිජිටල් තාක්ෂණයට අනුගතවීම සඳහා අවශ්‍ය මගපෙන්වීම කෙරෙහි ජනමාධ්‍ය අංශයේ අවධානය යොමු වී තිබේ.

රජයේ මාධ්‍ය ආයතන නැවත යථා තත්ත්වයට පත් කිරීමේ දැඩි අභියෝගය මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇත. ජාතික ආර්ථිකයට බරක්ව පවතින, අඛණ්ඩව පාඩු ලබන සහ ඌන උපයෝජන රාජ්‍ය මාධ්‍ය ව්‍යවසායයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, එම ආයතනවල ව්‍යාපාර නැඹුරුව සහ මූල්‍ය විනය පිළිබඳව සමාලෝචනයක් සිදු කර, උපාය මාර්ගික සැලසුමකට අනුව එම සැලසුම නිශ්චිත කාල රාමුවක් තුල ක්‍රියාත්මක කර ප්‍රතිඵල ලබා ගැනීම සඳහා වන වගකීම අදාළ ආයතනවල කළමණාකාරිත්වය වෙත පවරා ඇති අතර එම ක්‍රියාවලියේ සමීප අධීක්ෂණය අඛණ්ඩව සිදු කරමින් පවතී.

එමෙන්ම මෙම රාජ්‍ය ආයතන සතු වත්කම් ඌන උපයෝජනය වෙමින් පවතින අතර මෙම වත්කම් පූර්ණ උපයෝජනයකට ලක් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා දැනටමත් අවශ්‍ය මගපෙන්වීම ලබාදී ඇත.

ජනමාධ්‍ය හා සන්නිවේදන ක්ෂේත්‍රයේ ගෝලීය වර්ධනය සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකාවේ මාධ්‍ය ප්‍රමිතිකරණය සඳහා පවතින අණපනත්, අන්තර්ජාතික මාධ්‍ය ආයතනවල ක්‍රියාකාරිත්වය සහ සමාජ, සංස්කෘතික අනන්‍යතා ක්ෂේත්‍රයන්ට විශේෂ අවධානය යොමු කරමින් රජයේ ප්‍රතිපත්ති හා ප්‍රමුඛතා යටතේ ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ ක්‍රමවත් මාර්ගෝපදේශකත්වයක් උදෙසා ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක් (National Media Policy) සකස් කිරීම සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශය මේ වන විට කටයුතු ආරම්භ කර ඇත.

එමෙන්ම මාධ්‍ය ආචාර ධර්ම (Media Ethics) පද්ධතියක අවශ්‍යතාවය මෙම අමාත්‍යාංශය හඳුනාගෙන ඇති අතර ඒ සම්බන්ධයෙන්ද කටයුතු ආරම්භ කර ඇත.

ඉහළ වෘත්තීයමය නිපුනතා සහිත මාධ්‍ය වෘත්තිකයන් බිහිකිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව රාජ්‍ය අනුග්‍රහය සහිත ජනමාධ්‍ය උසස් අධ්‍යාපන ආයතනයක් ‘ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයින්ගේ

ආයතනය' (Chartered Institute of Media Professionals of Sri Lanka) යන නමින් පිහිටුවීමට අවශ්‍ය නීතිමය පසුබිම සකස් කෙරමින් පවතී. මෙම ආයතනය තුලින් ජනමාධ්‍යවේදීන් සඳහා වරලත්භාවය පිරිනැමීමට අපේක්ෂිතය.

ශ්‍රී ලාංකේය ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම අරමුණු කරගනිමින් 'ඇසිදිසි' ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන වාර්ෂිකව ක්‍රියාවට නංවනු ලැබේ. අයදුම්කරුවන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් ජනමාධ්‍යවේදීන් සඳහා නිකුත් කරන ජනමාධ්‍යවේදී හැඳුනුම්පත ලබා තිබිය යුතුය. උපාධි හෝ පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා රුපියල් 200,000/ ක්ද සහතිකපත්‍ර පාඨමාලාවක් හැදෑරීම සඳහා රුපියල් 100,000/ මුදලක්ද මෙම ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය මගින් ලබා දේ. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි (UNDP) මූල්‍ය දායකත්වය යටතේ යහපත් මාධ්‍ය සදාචාරයක් ස්ථාපිත කිරීම හා මාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම සඳහා වැඩසටහන් පෙළක්ද මෙම වර්ෂයේදී පවත්වා ඇත.
ජාතික ආරක්ෂාවට සහ සංහිඳියාවට තර්ජනයක් නොවන අයුරින් පුවත් වෙබ් අඩවි පවත්වාගෙන යාම වැදගත් කොට සලකන බැවින් මෙම වෙබ් අඩවි ලියාපදිංචි කිරීමේ හා අලුත් කිරීම ස්වාධීන කමිටුවක් මගින් සිදු කෙරේ.

මාධ්‍යවේදීන් විසින් ඉටුකරනු ලබන මෙහෙවර සහ ඔවුන්ගේ දායකත්වය අගයකිරීමත්, ගුණාත්මක මාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීම සඳහාත් ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල වාර්ෂිකව පැවැත්වීමට සැලසුම් කර ඇත.

ශ්‍රී ලංකාව තුල ගුවන්විදුලි හා විකාශන විෂයයන්ට බලපාන මූලික ව්‍යවස්ථාවන් වනුයේ 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනත හා 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනි රූපවාහිනී සංස්ථා පනතය. මෙම පනත්වල ප්‍රතිපාදන අනුව පෞද්ගලික රූපවාහිනී හා ගුවන්විදුලි විකාශන සේවාවන් පවත්වාගෙන යාම සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් බලපත්‍ර ලබාදීම සිදු කරයි.

විකාශන බලපත්‍රයන්හි ඒකමතිකභාවයක් ඇතිකිරීම සඳහා පොදු ආකෘතියක් හඳුන්වාදීමට කටයුතු කෙරෙමින් පවතී.
කාලීන අවශ්‍යතාවයන්ට අනුගත වෙමින් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ඇති ආයතනවලට අදාළ යල්පැන ගිය අණපනත් සංශෝධනය කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු වේ. අදාල නීති වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කිරීම තුලින් එම ආයතන මාධ්‍ය ක්ෂේත්‍රයේ පවත්නා දැඩි තරඟකාරීත්වයට සාර්ථකව මුහුණදීමට හැකි වන පරිදි ශක්තිමත් වනු ඇත.

විදේශීය ටෙලි නාට්‍ය හා චිත්‍රපට මෙරට මාධ්‍යයන්හි විකාශය කිරීම සඳහා අනුමැතිය ලබා දීම විද්වත් මඩුල්ලක් මඟින් අඛණ්ඩව සිදු කෙරේ.
ප්‍රවෘත්ති වෙබ් අඩවි ලියාපදිංචි කිරීම සහ ආනයනය කරන ලද ටෙලි නාට්‍යල චිත්‍රපට හා වාණිජ වැඩසටහන් සඳහා බදු අයකිරීම මගින් ජනමාධ්‍ය අමාත්‍යාංශය මහා භාණ්ඩාගාරයට ආදායම් උපයා දෙනු ලැබේ.

භෞමික රූපවාහිනී විකාශනය ප්‍රතිසම (Analog) ක්‍රමවේදයේ සිට අංකිත (Digital) ක්‍රමවේදය දක්වා ගමන් කරන ගෝලීය ප්‍රවණතාවයට ශ්‍රී ලංකාවද අනුගත විය යුතුය. ප්‍රතිසම තාක්ෂණය භාවිතයෙන් සංඛ්‍යාත පරාසය අපතේ යාමක් සිදුවන අතර එම සංඛ්‍යාත පරාස අනෙකුත් විදුලි සංදේශ සේවාවන්ට යොදා ගැනීමට ඇති හැකියාව මගහැරී ඇත. මේ අනුව ජපාන ණය සහන ණය ගිවිසුමක් ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී විකාශනය අංකිත කිරීමේ ව්‍යාපෘතිය' (Digital Terrestrial Television Broadcasting – DTTB Project) ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 2016 අගෝස්තු මස 04 වන දින සිට බලාත්මක 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක කර එය සමාජගත කිරීම සම්බන්ධයෙන් වන වගකීම ජනමාධ්‍ය විෂය අයත් රේඛීය අමාත්‍යාංශය වෙත පැවරී ඇත. ඒ අනුව තොරතුරු පනත පිළිබඳ පොදු අධිකාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ අංශය මගින් හඳුනාගෙන ඇති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කර ඇත.

2025-2029 කාල රාමුව තුල ශ්‍රී ලංකාව ලභා කර ගැනීමට අපේක්ෂා කරන සංවර්ධන පරමාර්ථ, අරමුණු හා ඉලක්කවල ප්‍රගතිය අධීක්ෂණය කරමින් ජාතික සංවර්ධන ප්‍රමුඛතාවය එමෙන්ම එකී ප්‍රමුඛතාවයන්ට අනුරූප ක්ෂේත්‍රවල ප්‍රමුඛතාවයන් සහ එම ක්ෂේත්‍ර ඒකාබද්ධ කරමින් සකස් කල සැලසුම් අනුව අපේක්ෂිත ප්‍රගතිය ලභා වන්නේදැයි පසු විපරම් කිරීම සඳහා ආයතනික ප්‍රතිඵල රාමුව (Organizational Results Framework – ORF) සකස් කර අවසන්ය. කාර්ය සාධන දර්ශක මත පදනම්වූ ඇගයීම් ක්‍රමවේදය හරහා ආයතනවල කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ප්‍රශස්ත මට්ටමකට ඉහල නැංවීමට කටයුතු කෙරේ.

'Clean Sri Lanka' වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතන විසින් තම වැඩසටහන් හඳුනා ගනිමින් පවතී. මේ සඳහා දැනුවත් කිරීම් හා අවශ්‍ය මහ පෙන්වීම ජනාධිපති ලේකම් කාර්යාලයේ මැදිහත්වීම මත මේ වනවිටත් සිදු කොට ඇත. එක් එක් ආයතනයන් විසින් 'Clean Sri Lanka' වැඩසටහනට අදාලව ක්‍රියාත්මක කරන වැඩසටහන් සම්බන්ධව පසුවිපරම් කිරීම හා අවශ්‍ය මහ පෙන්වීම අඛණ්ඩව සිදු කිරීමට අමාත්‍යාංශය පියවර ගනු ලැබේ.

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය වන 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' මත පදනම්ව ජනමාධ්‍ය අංශයට අදාල ක්‍රියාකාරකම් හඳුනාගෙන ඇත. මෙම ක්‍රියාකාරකම් වසර 5 ක කාලරාමුවක් යටතේ ඉටු කිරීමට මෙහෙයුම් ක්‍රියාවලියක් හඳුනා ගනිමින් පවතී. ඒ අනුව වාර්ෂික ක්‍රියාත්මක සැලසුම් සමඟ උපායක්‍රමික සැලැස්මක් ගොඩ නඟන අතර ඒ සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය අධීක්ෂණයෙන් සිදු වන පසුවිපරම් හා නියාමන ක්‍රියාවලිය සමඟ බද්ධව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය මාධ්‍ය හැසිරවීමේදී තොරතුරුවල සමබරතාවය ආරක්ෂා කරමින් අගති විරහිත වන පරිදි ක්‍රියාත්මක වීමට ජනමාධ්‍ය අංශය ඉදිරියේදීත් කටයුතු කරනු ඇත.

1.2 දැක්ම, මෙහෙවර, පරමාර්ථ

දැක්ම

'මනාව දැනුම්වත් වූ, බහුමතික සහ සක්‍රීය සමාජයක්'

මෙහෙවර

'ජනහිතකාමී වූ, සංවර්ධනයට දිශානත වූ, නිදහස් සහ වගකීම් සහිත ශ්‍රී ලාංකේය ජනමාධ්‍ය කලාවක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රතිපත්ති හා උපාය මාර්ග සැකසීම, පහසුකම් සැලසීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පසු විපරම'

පරමාර්ථ

- වඩා යහපත් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැංවීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම.
- මහජනතාවට තොරතුරු වෙත ප්‍රවේශවීමේ සමාන අවස්ථාවන් පුළුල් කිරීම.
- නවීනතම තාක්ෂණය සමඟ මාධ්‍ය ක්ෂේත්‍රය වෙත පහසුකම් සැලසීම.
- මාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම උදෙසා දිරිගැන්වීම.
- ජාතික සංවර්ධන ප්‍රයත්නයේදී මාධ්‍ය දායකත්වය සහ සහභාගිත්වය ඉහළ නැංවීම.
- ජාත්‍යන්තර වශයෙන් රටෙහි ප්‍රතිරූපය ඔප්නැංවීම උදෙසා නායකත්වය සැපයීම.
- අමාත්‍යාංශයේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා මානව සම්පත සංවර්ධනය කිරීම.
- අමාත්‍යාංශයේ අනුබද්ධිත ආයතනයන්හි සම්පත් සාර්ථකව ප්‍රයෝජනයට ගැනීම.
- අදාල පාර්ශවයන් සම්බන්ධීකරණය කිරීම තුලින් සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.

1.3 විෂයපථය, කාර්යයන්, කර්තව්‍යයන් හා සුවිශේෂී ප්‍රමුඛතා

1.3.1 විෂය පථය

භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස ඇතුළුව නිවැරදි තොරතුරු දැනගැනීමේ ජනතා අයිතිය තහවුරු කරන තොරතුරු දැනුම හා මතවාදයන් සමබර සන්නිවේදනයක් සඳහා උචිත ජනමාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීම මෙන්ම රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ''විනිවිදභාවයෙන් යුතු ජනමාධ්‍ය සංස්කෘතියක් හඳුන්වාදීම'' සඳහා නියමිත නීති සහ අණ පනත්වලට අනුකූලව ජනමාධ්‍ය විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

1.3.2 කාර්යන් හා කර්තව්‍යයන්

රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ජනමාධ්‍ය විෂයයට සහ අදාල දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.


- විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලු ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
- ජනතාවගේ නිවැරදි තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ගයන් ගැනීම.
- රජයේ මුද්‍රණ හා ප්‍රකාශන කටයුතු
- ජනතාවගේ දැනුම ආකල්ප හා රසඥතාවය දියුණු කරමින් ආර්ථික, සාමාජීය, සංස්කෘතික දියුණුව සඳහා ජනමාධ්‍යයෙහි දායකත්වය ලබාදීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායයන් සම්පාදනය කිරීම.
- මාධ්‍ය භාවිතය සඳහා නවීන තාක්ෂණය යොදාගැනීම වර්ධනය කිරීම.
- ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් හඳුන්වාදීම.
- රාජ්‍ය නිල නිවේදන හා ප්‍රවෘත්ති පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- ශ්‍රී ලංකාව පිළිබඳ අදාළ තොරතුරු දේශීය හා විදේශීය ජනමාධ්‍ය ආයතනවලට නිකුත් කිරීම.
- විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අවශ්‍ය තොරතුරු හා ප්‍රචාරක සේවා සැපයීම.
- ප්‍රවෘත්ති, චිත්‍රපට හා වාර්තාමය වැඩසටහන් නිෂ්පාදනය හා ප්‍රදර්ශනය කිරීම පිණිස උචිත ක්‍රියාමාර්ග ගැනීම.
- වාණිජ රූපවාහිනී හා ගුවන් විදුලි ප්‍රචාර සහ විදේශ විකාශයන් ඇතුළු ප්‍රචාරක කටයුතු
- නවතම තාක්ෂණය සහ කළමනාකරණ ක්‍රමවේදයන් භාවිත කරමින් විවිධත්වය තුලින් ව්‍යාපාර අරමුණු කර ගත් නවීන තැපැල් සේවයක් ලබාදීම සහ දේශීය හා විදේශීය තැපැල් සේවා කටයුතු කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම.
- ලංකා මුද්දර කාර්යාංශය පරිපාලනය කිරීම.
- දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවලට පැවරී ඇති අනෙකුත් සියලු විෂයයන්ට අදාළ කටයුතු
- දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා අධීක්ෂණය

1.3.3 සුවිශේෂී ප්‍රමුඛතා

- විනිවිදභාවයෙන් යුත් ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් හඳුන්වා දීම.
- ජාතික හා ජාත්‍යන්තර නීති රෙගුලාසිවලට අනුගත වන පරිදි මාධ්‍ය ප්‍රමිතීන් ස්ථාපිත කිරීම.
- ජනමාධ්‍යවේදීන් සහ ජනමාධ්‍ය ආයතන සඳහා සමාජ සංස්කෘතික වටිනාකම් සහ සමාජ සාරධර්ම පිළිබඳ රාමුව ඉක්මවා නොයන පරිදි කටයුතු කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම.

- ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම.
- මාධ්‍යවේදීන්ට පහසුකම් සැපයීම සඳහා පළාත් මට්ටමෙන් කටයුතු සිදුකිරීම.
- ශ්‍රී ලංකා තැපැල් සේවය ජනතා අවශ්‍යතා සඳහා පුළුල් කිරීම.
- සමාජ මාධ්‍ය ඇතුලු නව මාධ්‍ය භාවිතය සහ හැසිරවීම පිළිබඳ වෘත්තීමය දැනුම හා අවබෝධය ලබාදීම සඳහා සමාජ අධ්‍යාපන ක්‍රමවේදයක් හඳුන්වා දීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ජනමාධ්‍ය උසස් අධ්‍යාපන වෘත්තීමය කුසලතා ප්‍රවර්ධන අවස්ථාවන් ඇති කිරීම.
- නව තාක්ෂණය පදනම්ව කාර්යක්ෂම හා නව අවස්ථාවන්ට ඉලක්කගත වූ ජනතා කේන්ද්‍රීය ඩිජිටල් තැපැල් හා ආශ්‍රිත සේවාවන් සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම.

1.4 සංවිධාන සටහන - 2024



1.5 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු

i) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

ii) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

iii) ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව

1.6 අමාත්‍යාංශය යටතේ ඇති ආයතන

i) තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

ii) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

iii) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

iv) සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය

v) සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

vi) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

vii) ශ්‍රී ලංකා පදනම

viii) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

ix) සීමාසහිත ලංකා පුවත් ආයතනය

x) මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාව

xi) ශ්‍රී ලංකා මාධ්‍ය පුහුණු ආයතනය

xii) ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

xiii) ප්‍රසිද්ධ රැහුම් පාලක මණ්ඩලය

xiv) සැලසිනෙ මීඩියා සොලුෂන් (පෞද්) සමාගම

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව, ප්‍රසිද්ධ රැහුම් පාලක මණ්ඩලය සහ සැලසිනෙ සැලසිනෙ මීඩියා සොලුෂන් (පෞද්) සමාගම අංක 2412/08 හා 2024.11.25 දිනැති ගැසට් පත්‍රය මඟින් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතට පැවරී ඇත.

1.7 විදේශ මූල්‍යනය මත දිවෙන ව්‍යාපෘති පිළිබඳ තොරතුරු

අ) ව්‍යාපෘතියේ නම : ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී විකාශනය අංකිත කිරීමේ ව්‍යාපෘතිය

ආ) ආධාර ලබා දෙන ආයතනය : ජපාන රජය (JICA)

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය : ජපන් යෙන් මිලියන 17,717
(JICA ආයතනයේ දායකත්වයේ වටිනාකම ජපන් යෙන් මිලියන 13,717 ක්ද රජයේ දායකත්වය ජපන් යෙන් මිලියන 3,505 ක්ද වශයෙනි.)

ඈ) ව්‍යාපෘති කාලය : 2021 - 2028

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ජයග්‍රහණ - ප්‍රගතිය හා ඉදිරි දැක්ම - 2024

2.1.1 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 2016 අගෝස්තු මස 04 වන දින සිට බලාත්මක වූ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක කර එය සමාජගත කිරීම සම්බන්ධයෙන් වන වගකීම ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පැවරී ඇත. 2017 පෙබරවාරි මස 03 වන දින සිට මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ අතර රජයේ නිල තොරතුරු ජනතාවට දැනගැනීමේ අයිතිය තහවුරු කිරීමෙන් රටේ ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලන මූලධර්ම මනාව ක්‍රියාවට නැංවීමත් එමගින් දූෂණයෙන් තොර යහපත් වගකීම් සහිත රාජ්‍ය සේවාවක් ස්ථාපිත කිරීමත් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි මූලික පරමාර්ථය විය. මෙම පනත සමාජගත කිරීම උදෙසා 2017 වසරේ සිටම ජනමාධ්‍ය අමාත්‍යාංශය අඛණ්ඩව සක්‍රීය ලෙස දායක විය.

2016 අංක 12 දරණ තොරතුරු අයිතිවාසිකම් පනත අනුව ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම හා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව හා සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරීම.

තොරතුරු අයිතිවාසිකම් පනත ප්‍රකාරව සහ තොරතුරු ඉල්ලීමේ ක්‍රමවේදයට අනුව කොමිෂන් සභාව සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී. මේ වන විට වාර්ෂික වාර්තා සහ අර්ධ වාර්ෂික වාර්තා මෙන්ම ද්විමාසික තත්ත්ව වාර්තා 20 ක් තොරතුරු කොමිසම වෙත යොමු කර ඇත. එමෙන්ම පුරවැසියන් හෝ පොදු අධිකාරීන් විසින් කොමිෂන් සභාව වෙතින් ඉටුකළ යුතු කාර්යයන් සම්බන්ධව සහ තොරතුරු අයිතිවාසිකම් කොමිෂන් සභාවේ විවිධ ඉල්ලීම් අදාළ ආයතන වෙත යොමු කිරීම සිදු කර ඇත.

2.1.2 තොරතුරු අයිතිවාසිකම් පනත හා සම්බන්ධ උපදේශන සේවා සැපයීම

2024 වර්ෂයේ මේ සම්බන්ධයෙන් දෛනිකව විධිමත් උපදේශන සේවා සැපයීම සිදුකරන ලදී. පුද්ගලයින් 930 ක් සඳහා විධිමත් උපදේශන ලබාදී ඇත. මෙහිදී පුරවැසියන්ට තොරතුරු පනත සම්බන්ධයෙන් උපදේශන සේවා සැපයීම මෙන්ම තොරතුරු අයිතිවාසිකම් පනත සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමට සහ පර්යේෂණ කිරීමට පැමිණෙන පුරවැසියන් දැනුවත් කිරීම සිදු වේ.

2.1.3 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ නිල වෙබ් අඩවිය (www.rti.gov.lk) පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම

පුරවැසියන්ට ඵලදායී ලෙස තොරතුරු අයිතිවාසිකම් පනත භාවිතයට ගැනීම මෙහි අරමුණයි. එමෙන්ම තොරතුරු අයිතිවාසිකම පිළිබඳ පුරවැසියන්ගේ දැනුවත්භාවය වැඩිකිරීම හා තොරතුරු ඉල්ලීම් මඟින් මහජන අවශ්‍යතා සැපයීමද අරමුණු වේ. මෙහිදී ඉදිරියේදී පැවත්වෙන වැඩසටහන් සම්බන්ධයෙන් වන ප්‍රචාරණය වැදගත් වෙයි. එමෙන්ම තොරතුරු අයිතිවාසිකම සම්බන්ධයෙන් ඉතා ක්‍රියාශීලී මෙන්ම වඩාත් ඵලදායී ලෙස භාවිතා කළ හැකි අයුරින් අමාත්‍යාංශ නිලධාරීන් යටතේ පවත්වාගෙන යන නව වෙබ් අඩවියක් නිර්මාණය කරන ලදී.

2.1.4 තොරතුරු අයිතිවාසිකම් පිළිබඳ විද්‍යුත් තැපෑල (rti@media.gov.lk) පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ ඒකකයේ භාවිතා කරන ලද විද්‍යුත් තැපෑල වෙනුවට නව විද්‍යුත් තැපෑලක් අමාත්‍යාංශ නිලධාරීන්ගේ පාලනය යටතේ පවත්වාගෙන යනු ලබයි. මෙහිදී පුරවැසියා විද්‍යුත් තැපෑල මඟින් යොමු කරන ලද තොරතුරු ඉල්ලුම් පත්‍ර, අදාළ ආයතන වෙත යොමු කරනු ලැබේ. එමෙන්ම පුරවැසියන්ට සහ පොදු අධිකාරිවල නිලධාරීන්ට ඇතිවන ගැටළු සඳහා පිළිතුරු අපේක්ෂාවෙන් යොමු කරන ලද විද්‍යුත් ලිපි සඳහා පිළිතුරු ලබාදීම සිදුකරනු ලැබේ.

2.1.5 තොරතුරු අයිතිවාසිකම පිළිබඳ තොරතුරු නිලධාරී අත්පොත, පුහුණු මාර්ගෝපදේශය සහ අත්පත්‍රිකා බෙදාහැරීම

තොරතුරු දැනගැනීමේ පනතට අදාළව පුහුණුකරුවන් පුහුණු කිරීමේ රජයේ නිලධාරීන්, පුරවැසියන් දැනුවත් කිරීමේ වැඩසටහන් 23 ක් දිවයින පුරා පවත්වන ලද අතර එම වැඩසටහන සඳහා සහභාගී වූවන්හට නිලධාරී අත්පොත්, පුහුණු මාර්ගෝපදේශය හා අත්පත්‍රිකා 6669 ක් බෙදා හරින ලදී. එම ප්‍රකාශන බෙදා හැරීම තුළින් ආයතනයන්හි තොරතුරු නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීම අපේක්ෂා කෙරේ.

2.1.6 පොදු අධිකාරීන්හි නම්කල නිලධාරීන් සහ තොරතුරු නිලධාරීන් සම්බන්ධ දත්ත පාදකය යාවත්කාලීන කිරීම

පොදු අධිකාරීන්හි අලුතින් පත්කරන ලද තොරතුරු නිලධාරීන් සහ නම්කළ නිලධාරීන් සම්බන්ධයෙන් තොරතුරු යොමු කෙරෙන අතර එම නිලධාරීන් පිළිබඳ විස්තර ඇතුළත් දත්ත පද්ධතියක් (Data Base) වෙබ් අඩවියේ ඇතුළත් වෙන අතර දෛනිකව යාවත්කාලීන කරනු ලැබේ. 2024.12.31 දින වන විට නව තොරතුරු 4231 ක දත්ත යාවත්කාලීන කොට ඇත.

2.1.7 තොරතුරු අයිතිවාසිකම් පනත සම්බන්ධයෙන් ෆේස්බුක් (Facebook) පිටුවක් පවත්වාගෙන යාම සහ සමාජ මාධ්‍යවල ප්‍රචාරය කිරීම.

විශේෂයෙන්ම තරුණ ප්‍රජාව ඉලක්ක කොට ගනිමින් සහ පුරවැසියන් සඳහා තොරතුරු අයිතිවාසිකම් පනත පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරනු ලබන RTI Facebook පිටුව මඟින් ආකර්ෂණීය ලෙස දැනුවත් කිරීම සිදු වෙයි. 2024 වසර තුළ සමස්ථ පරිශීලකයන් සංඛ්‍යාව 3620 ක් වේ. එමෙන්ම, තොරතුරු නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් සහ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවත්වීමේදී ඒ සම්බන්ධව Facebook පිටුවේ එදිනම පළ කරනු ලැබේ. 2024 වර්ෂයේදී වැඩසටහන් 15 ක විස්තර යාවත්කාලීන කොට ඇත.

2.1.8 තොරතුරු පනත පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්

කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කයන්හි තෝරාගත් පොදු අධිකාරීන්හි නිලධාරීන් සඳහා තොරතුරු පනත පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 16 ක් පවත්වන ලද අතර ඒ සඳහා සහභාගී වූ නිළධාරීන් සංඛ්‍යාව 2105 කි.

2.1.9 ජාත්‍යන්තර තොරතුරු අයිතිවාසිකම පිළිබඳ දින සැමරුම - 2024

අ) 2024 වර්ෂයට අදාල ජාත්‍යන්තර තොරතුරු දින සැමරුම සැප්තැම්බර් මස 28 දින යෙදී තිබුන ද පැවති මැතිවරණ කාලසීමාව හේතුවෙන් මෙම සැමරුම් උත්සවය 2024.12.10 දිනට යෙදෙන ජාත්‍යන්තර මානව හිමිකම් දිනය දා ජාතික චිත්‍රපට සංස්ථා තරංගනී ශාලාවේදී ගරු සෞඛ්‍ය හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

ආ) මෙම වැඩසටහන සඳහා සියලු අමාත්‍යාංශන්හි තොරතුරු නිලධාරීන් හා විෂය නිලධාරීන් 350 ක් සහභාගී විය.

ඇ) 2024 වර්ෂයට අදාළ ජාත්‍යන්තර තොරතුරු දින සැමරුමට සමගාමීව සමස්ත ලංකා පාසල් හා විවෘත පෝස්ටර් චිත්‍ර තරඟයක්, අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව සමස්ත ලංකා පාසල් කෙටි චිත්‍රපට තරඟයක්, පවත්වා ජයග්‍රාහකයන්ට ත්‍යාග සහ සහතික පත්‍ර ලබා දෙන ලදී.

ඈ) ප්‍රගාමී තොරතුරු හෙලිදරව් කිරීම සම්බන්ධ සියලුම අමාත්‍යාංශවල කාර්ය සාධනයන් පිලිබඳව වෙරිටේ රිසර්ච් ආයතනය සමග සමීක්ෂණයක් පවත්වා අදාල සමීක්ෂණ වාර්තාව 2024.12.10 දින එළිදැක්වීම සිදුකරන ලදී.

2.1.10 'පවත' ප්‍රකාශයට පත්කිරීම

'පවත' පුවත් පත 2024.12.10 දින විශේෂ කලාපයක් ලෙස දිනමිණ හා තිනකරන් පුවත්පත් සමග සිංහල හා දෙමළ භාෂාවෙන් ලේක්හවුස් ආයතනය මගින් ප්‍රකාශයට පත්කරන ලද අතර ඒ සමගම අන්තර්ජාලයට ද මුදා හරින ලදී.

2.1.11 ජාතික මාධ්‍ය ප්‍රතිපත්තිය සකස් කිරීම

ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ ක්‍රමවත් මාර්ගෝපදේශකත්වයක් උදෙසා ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශය කටයුතු ආරම්භ කළ අතර, ඒ සඳහා රාජ්‍ය මාධ්‍ය ප්‍රධානීන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්, නීතීඥයන්, විද්‍යුත් විකාශකයන්ගේ සංගමයේ නියෝජිතයන් සහ කර්තෘ සංසදයේ නියෝජිතයන්ගෙන් සමන්විත විද්වත් කමිටුවක් පත් කරන ලදී.

එම කමිටුව විසින් සියලු පාර්ශවකරුවන් ආවරණය වන අන්දමට යොමුගත කණ්ඩායම් විසින් සාකච්ඡා 07 ක් පහත පරිදි පවත්වමින් ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියෙහි මූලික කෙටුම්පත සකස් කිරීමේ කටයුතු සිදුකරන ලදී.

i. අධ්‍යයන
ii. ජනමාධ්‍ය සංගම්
iii. අයිතිවාසිකම් පදනම් වූ සංවිධාන
iv. විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන
v. උතුරු පළාත කේන්ද්‍ර කරගත් සාකච්ඡා
vi. නැගෙනහිර පළාත කේන්ද්‍ර කරගත් සාකච්ඡා
vii. පාසල් මාධ්‍ය සංගම්

මෙහිදී උතුරු හා නැගෙනහිර පළාත්වල මාධ්‍යවේදීන්ගේ හා මාධ්‍ය ක්ෂේත්‍රයට අදාල සමාජ ක්‍රියාකරුවන්ගේ අදහස් ලබා ගැනීම ඉතා වැදගත් ලෙස සලකනු ලැබූ බැවින්, යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී සහ මඩකලපු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී යොමුගත කණ්ඩායම් සාකච්ඡා 02ක් පවත්වන ලද අතර එහිදී එම ප්‍රදේශවලට ආවේණික ගැටළු හඳුනාගැනීමටත්, නව අදහස්/ යෝජනා ලබා ගැනීමටත් හැකි විය.

මෙම විධිමත් ක්‍රමවේදයන් ඔස්සේ සියලු පාර්ශවකරුවන්ගෙන් ලබා ගන්නා ලද අදහස් / යෝජනා වඩා විධිමත් සහ ප්‍රායෝගික ක්‍රමවේදයන් අනුගමනය කරමින් මාධ්‍ය ක්ෂේත්‍රය තුළ දැනට නිරීක්ෂණය වන පොදු දුර්වලතාවයන් මහ හරවා ගනිමින් මාධ්‍ය ක්ෂේත්‍රය නව දිශානතියකට යොමු කිරීම අරමුණු කර ගනිමින් සකස් කරන ලද ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියෙහි මූලික කෙටුම්පත අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා 2024.03.28 දිනැතිව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

2.1.12 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි (UNDP) ප්‍රදානයන් යටතේ ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලබන මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන

ජනමාධ්‍ය අමාත්‍යාංශය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) හා එක්ව 2021 නොවැම්බර් මස 29 වන දින Secretary General's Peace Building Funds ව්‍යාපෘතිය යටතේ Countering Hate Speech through Education & Advocacy for Improving Social Cohesion in Sri Lanka (PBF) ව්‍යාපෘතිය සඳහා අත්සන් තබන ලදී. එසේම, 2023.05.12 වන දින ඉදිරි මාස 09 ක් සඳහා ව්‍යාපෘතිය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් වන ගිවිසුමටද අත්සන් තබන ලදී.

එම ව්‍යාපෘතියේ මූල්‍ය දායකත්වය යටතේ යහපත් මාධ්‍ය සදාචාරයක් ස්ථාපිත කිරීම හා මාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් මාධ්‍ය පරිපාලක, කර්තෘ, තාක්ෂණික හා ප්‍රාදේශීය මාධ්‍යවේදීන් යන කණ්ඩායම් සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මෙම වැඩසටහන සඳහා විශ්ව විද්‍යාල ආචාර්යවරුන් සහ ක්ෂේත්‍රයේ ප්‍රවීණ විද්වත් මණ්ඩලයක් සම්පත්දායකත්වය සඳහා තෝරාගෙන ඇත.

"වාර්තාකරණයේ මූල මැද අග" තේමා කර ගනිමින් මෙම ව්‍යාපෘතියේ පළමු පියවර ලෙස විද්‍යුත් මාධ්‍ය ප්‍රධානීන් හා මුද්‍රිත මාධ්‍ය ප්‍රධානීන් දැනුවත් කිරීමේ වැඩසටහන ගරු ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිතගේ ප්‍රධානත්වයෙන් මෙම වසරේ අගෝස්තු මස 02 හා 03 යන දිනයන්හිදී පවත්වන ලදී. එහිදී යහපත් මාධ්‍ය සදාචාරයක් සඳහා වන අවම එකඟවීම් කෙටුම්පත් කරන ලදී.

ඉලක්කගත දෙවන කණ්ඩායම ලෙස මාධ්‍ය ආයතනයන්හි ප්‍රවෘත්ති මැදිරි තුළ (News Room) විශේෂ කාර්යභාරයක් ඉටුකරනු ලබන මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2023.09.27 වන දින පවත්වන ලදී. එම වැඩසටහනේදී යහපත් මාධ්‍ය සදාචාරයක් සඳහා අවම එකඟවීම් වැඩිදුරටත් සාකච්ඡා කරන ලදී.

ඒ අනුව ප්‍රාදේශීය මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන පළාත් 9 ම ආවරණය වන පරිදි මාධ්‍යවේදීන් 373 ක් සඳහා පවත්වන ලදී.

2.1.13 රාජ්‍ය අනුග්‍රහය සහිතව ජනමාධ්‍ය උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවීම

ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ සේවයේ නියුතු මාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය (Chartered Institute of Media Professionals of Sri Lanka) යන මැයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට සමාන්තර ස්වාධීන ආයතනයක් මහා බ්‍රිතාන්‍යයේ දැනට ස්ථාපිත වරලත් ජනමාධ්‍ය ආයතනය පදනම් කරගනිමින් රාජ්‍ය අනුග්‍රහය සහිතව ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත. මේ වන විට මෙම ආයතනය ස්ථාපිත කිරීම සඳහා වන පනත් කෙටුම්පත අවසන් කර ඇති අතර අවශ්‍ය අනුමැතීන් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් පසුව නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. මෙම ආයතනය තුලින් ජනමාධ්‍යවේදීන් සඳහා වරලත්භාවය පිරිනැමීමට අපේක්ෂිතය. දැනුමෙන් හැකියාවෙන් පරිපූර්ණ දක්ෂ මාධ්‍යවේදීන් හා මාධ්‍ය වෘත්තිකයන් බිහි කර ගැනීම මෙම ජනමාධ්‍ය උසස් අධ්‍යාපන ආයතනයෙන් අපේක්ෂා කෙරේ.

2.1.14 ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල - 2023

මාධ්‍යවේදීන් විසින් ඉටුකරනු ලබන මෙහෙවර සහ ඔවුන්ගේ දායකත්වය අගයකිරීමත් ගුණාත්මක මාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීම සඳහාත් ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙලක් පැවැත්වීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි ව ඇත. ඒ අනුව 2018 වර්ෂයට අදාලව ප්‍රථම වරට 2019 වර්ෂයේ දී ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල පවත්වා ඇත. මෙම සම්මාන උළෙලේ දී ගුවන්විදුලි, රූපවාහිනී, පුවත්පත්, වෙබ් අඩවි යන ක්ෂේත්‍ර 04 සඳහා භාෂාත්‍රයෙන් සම්මාන 51 ක් පිරිනමා ඇත. නමුත් ඉන්පසුව වාර්ෂිකව ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල සංවිධාන කටයුතු සිදු කළ ද ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොවීම, Covid - 19 වසංගතය හා වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ මෙම උළෙල 2020, 2021 හා 2022 යන වර්ෂයන්හිදී පැවැත්වීමට නොහැකි වී ඇත.

2024 ජාතික අයවැයෙන් රු.මි. 20 ක ප්‍රතිපාදනයක් ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල පැවැත්වීම සඳහා වෙන් විය. 2023 වර්ෂයට අදාලව නිර්මාණ අගය කරමින් ‘ජනාධිපති මාධ්‍ය සම්මාන 2024’ උළෙල පැවැත්වීම සඳහා එවකට ගරු ඇමතිතුමා වෙතින් 2024.10.01 දිනැතිව අනුමැතිය ලැබිණි. ඒ අනුව 2024.10.08 දින සියලුම පෞද්ගලික හා රාජ්‍ය මාධ්‍ය ආයතන ප්‍රධානීන් කැඳවා ‘ජනාධිපති මාධ්‍ය සම්මාන 2024’ උලෙළ පැවැත්වීම නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී.

ජනාධිපති මාධ්‍ය සම්මාන 2024, තරඟ අංශ 06 ක් යටතේ සම්මාන 50 ක් හා යාවජීව සම්මාන 04 ක් ඇතුළත්ව සම්මාන 54 ක් සඳහා 2023 වර්ෂයට අදාල නිර්මාණ අගයමින් පැවැත්වීමට අයදුම්පත් කැඳවන ලද අතර ඒ අනුව අයදුම්පත් 1005 ක් පමණ ලැබී ඇත.

ඒ අනුව, මෙහෙයුම් කමිටුව පත්කර අවශ්‍ය සංවිධාන කටයුතු සිදු කරන අතර විශ්වවිද්‍යාල මහාචාර්ය, ආචාර්යවරුන්ගේ හා ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ගෙන් සමන්විත විනිශ්චය මණ්ඩල මඟින් සම්මානලාභීන් තෝරා අවසන් කර ඇත. අතර උළෙල පැවැත්වීම සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

2.1.15 ප්‍රවෘත්ති වෙබ් අඩවි ලියාපදිංචි කිරීම

අංක 12/1037/37/019-1 සහ 13.08.2012 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ප්‍රවෘත්ති වෙබ් අඩවි ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කරනු ලැබේ. සෑම වෙබ් අඩවියක්ම ලියාපදිංචි කිරීම සඳහා රු. 25,000.00 ක් ද ලියාපදිංචිය වාර්ෂිකව අලුත් කිරීම සඳහා රු. 10,000.00 ක මුදලක් ද අමාත්‍යාංශය වෙත බැර කළ යුතුය. 2024 වර්ෂය තුළ අමාත්‍යාංශය යටතේ ප්‍රවෘත්ති වෙබ් අඩවි 27 ක් ලියාපදිංචි කර ඇති අතර වෙබ් අඩවි 37 ක ලියාපදිංචිය අලුත් කර ඇත.

2.1.16 රූපවාහිනී හා ගුවන්විදුලි බලපත්‍ර නිකුත් කිරීම

ශ්‍රී ලංකාව තුළ ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශන විෂයයන්ට බලපාන මූලික ව්‍යවස්ථාවන් වනුයේ 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනත සහ 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතය. යථෝක්ත පනත්වල සඳහන් ව්‍යවස්ථා ප්‍රතිපාදන අනුව පෞද්ගලික ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශන සේවාවන් පවත්වාගෙන යාම සඳහා මෙම අමාත්‍යාංශය මඟින් බලපත්‍ර ලබා දීම ද සිදු කර ඇත.

2024 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාකාරීව පවතින පෞද්ගලික ගුවන්විදුලි හා රූපවාහිනී බලපත්‍ර සංඛ්‍යාව හා නාලිකා සංඛ්‍යාව

බලපත්‍ර වර්ගීකරණය	පෞද්ගලික බලපත්‍රලාභී ආයතන සංඛ්‍යාව	නාලිකා සංඛ්‍යාව
ගුවන්විදුලි	18	51
භෞමික රූපවාහිනී	16	24

සේවා සපයන ආයතන

බලපත්‍ර වර්ගීකරණය	බලපත්‍රලාභී ආයතන සංඛ්‍යාව
කේබල් රූපවාහිනී	06
චන්ද්‍රිකා රූපවාහිනී	03
අන්තර්ජාල මත පදනම් වූ රූපවාහිනී	03
එකතුව	**12**

තවද රාජ්‍ය ගුවන්විදුලි ආයතන දෙක වන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව හා සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය ඔස්සේ ප්‍රාදේශීය සේවාවන්ද ඇතුළුව ගුවන්විදුලි නාලිකා 15 ක් පවත්වාගෙන යනු ලබන අතර ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය යන ආයතන දෙක ඔස්සේ රූපවාහිනී සේවාවන් 05ක් පවත්වාගෙන යනු ලැබේ. භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස උපරිමයෙන් ආරක්ෂා කරමින් වඩා යහපත් මාධ්‍යකරණයක් සඳහා දැනට නිකුත්කර ඇති ගුවන්විදුලි හා රූපවාහිනී විකාශන බලපත්‍රයන්හි ඒකමතිකභාවයක් ඇතිකිරීමේ අරමුණින් පොදු ආකෘතියක් හඳුන්වාදීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවී ඇත. ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් කමිටුවක් පත්කර නිකුත් කර ඇති ගුවන්විදුලි හා රූපවාහිනී විකාශන බලපත්‍ර සමාලෝචනය සිදු කර සකස් කරන ලද පොදු ආකෘති පත්‍රය නීතිපති උපදෙස් ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

2.1.17 ප්‍රාදේශීය මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන – Journalism with Care

ළමුන් පිළිබඳව මාධ්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් ප්‍රාදේශීය මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් UNICEF සංවිධානයේ මූල්‍ය දායකත්වය යටතේ දෙසැම්බර් මස කොළඹ, යාපනය, නුවර සහ ගාල්ල යන දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් ප්‍රාදේශීය මාධ්‍යවේදීන් 166 ක් සඳහා පවත්වන ලදී.

ආචාරධාර්මික වාර්තාකරණයක් සඳහා ප්‍රාදේශීය මාධ්‍යවේදීන් පෙළඹවීමට අදාළ නෛතික ප්‍රතිපාදන සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කිරීමත් එමඟින් වඩාත් යහපත් මාධ්‍ය සංස්කෘතියක් නිර්මාණය කිරීමත් එහි ප්‍රමුඛතම අරමුණ විය.

2.1.18 කාන්තාවන් සහ ජනවාර්ගික - ආගමික සුළුතරයන්ගේ ගරුත්වය සුරැකීම කෙරෙහි අවධානය යොමු කරමින් මාධ්‍යවේදීන් සඳහා අචාරධර්ම සංග්‍රහයක් හඳුන්වාදීම

'කාන්තාව සාමය හා ආරක්ෂාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2023 2027 යටතේ කාන්තාව සහ ජනවාර්ගික - ආගමික සුළුතරයන්ගේ ගරුත්වය සුරැකීම කෙරෙහි අවධානය යොමු කරමින් මාධ්‍යවේදීන් සඳහා අචාරධර්ම සංග්‍රහයක් හඳුන්වාදීම මෙම අමාත්‍යාංශ වෙත පැවරී ඇත.

ඒ සඳහා විද්වත් කමිටුවක් පත් කර ඇති අතර, කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය කමිටුව මඟින් සිදු කර අවසන් වීමෙන් පසුව පාර්ශවකරුවන්ගේ අදහස් ලබා ගැනීමට නියමිතය.

2.1.19 'ඇසිදිසි' ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන

ශ්‍රී ලාංකේය ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තියභාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් ඇසිදිසි ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන වාර්ෂිකව ජනමාධ්‍ය අමාත්‍යාංශය මඟින් ක්‍රියාවට නංවනු ලැබේ.

වසර තුනක සේවා කාලය සපුරා ඇති, දිවයිනේ පිළිගත් විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ආයතනවල පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන පදනම මත සේවයේ නියැලී සිටින වයස අවුරුදු 18-55 ත් අතර මාධ්‍යවේදීන්, නිදහස් මාධ්‍යවේදීන්, ප්‍රාදේශීය මාධ්‍යවේදීන් හා වෙබ් මාධ්‍යවේදීන්ට මෙම ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා අයදුම් කළ හැකිය.

තවද ඉල්ලුම් කරන පාඨමාලාව සෘජුවම ජනමාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ පාඨමාලාවක් වියයුතු අතර අයදුම්කරුවන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් ජනමාධ්‍යවේදීන් සඳහා නිකුත් කරන ජනමාධ්‍යවේදී හැඳුනුම්පත ලබා තිබිය යුතුය.

උපාධි හෝ පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා රුපියල් 200,000 ක්ද රජයේ පිළිගත් ආයතනයක් යටතේ කෙටි කාලීන හෝ දිගු කාලීන සහතික පත්‍ර පාඨමාලාවක් හැදෑරීම සඳහා රුපියල් 100,000 ක මුදලක්ද මෙම ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය මඟින් ලබා දේ. පාඨමාලාව ආරම්භයේදී පාඨමාලා ගාස්තුවෙන් 50% ක්ද, ඉතිරි මුදල වාරික දෙකක් යටතේ ගෙවීමටද අවස්ථාව සලසා දී ඇත.

මෙම ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය මඟින් මාධ්‍යවේදීන්ට දෙවරක් ප්‍රතිලාභ ලබාගැනීමට අවස්ථාව සැලසෙන අතර පළමු අවස්ථාවේ සුදුසුකම් ලබා පාඨමාලාව සම්පූර්ණ කර වසර 05 ක් ඉක්ම ගිය පසු දෙවන අවස්ථාව සඳහා අයදුම් කළ හැක.

2006 වර්ෂයේ සිට අඛණ්ඩව ක්‍රියාත්මක වන මෙම වැඩසටහන මගින් 2024 වසර දක්වා ශිෂ්‍යත්ව 1033 ක් ප්‍රදානය කර ඇත. 2024 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලෙස රු. මිලියන 5 ක් ලබා දී ඇත. මෙම වර්ෂයට අදාළව ශිෂ්‍යත්ව ලබාදීම සඳහා මාධ්‍යවේදීන්ගෙන් අයදුම්පත් කැඳවා ඇත. ශිෂ්‍යත්ව ලබාදීම සඳහා සුදුසු මාධ්‍යවේදීන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් තෝරා ගැනේ.

2.1.20 ආනයනය කරන ලද ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ බද්ද වැඩසටහන් සඳහා බදු අයකිරීම

මෙම අමාත්‍යාංශය මඟින් 2016 අංක 11 දරන මුදල් පනත මඟින් පනවා ඇති නියෝගයන්ට අනුව රූපවාහිනී නාලිකා මඟින් විකාශනය කරනු ලබන ආනයනික වැඩසටහන් සඳහා බදු අය කෙරේ.

2024 දෙසැම්බර් 31 දින දක්වා ආනයනික ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් 1920 ක් සඳහා නිශ්කාෂණ සහතිකපත් නිකුත් කර ඇති අතර අයකර ගනු ලැබූ බදු මුදල රු.මි. 121.35 කි. එය ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී. මෙම කාර්යය සඳහා සමීක්ෂණ මණ්ඩල සාමාජිකයන් 28 දෙනෙකු සම්බන්ධ කර ඇති අතර දෛනිකව තිදෙනා බැගින් වන අනු කමිටු වාර 316 ක් මඟින් විකාශන අනුමැතීන් ලබාදී ඇත.

2024 දෙසැම්බර් 31 දින දක්වා බදු අයකරනු ලැබූ හා බද්දෙන් නිදහස් කරනු ලැබූ වැඩසටහන්

වැඩසටහන් වර්ගය	බද්දෙන් නිදහස් කරනු ලැබූ වැඩසටහන් සංඛ්‍යාව	බදු අයකරනු ලැබූ වැඩසටහන් සංඛ්‍යාව	බදු ආදායම (රු.මී.)
චිත්‍රපට	1126	40	4.8
ටෙලි නාට්‍ය හා වාර්තා වැඩසටහන්	123	543	88.95
වෙළඳ දැන්වීම් හා වෙළඳ වැඩසටහන්	-	88	27.6
එකතුව	**1249**	**671**	**121.35**

2.1.21 ජනමාධ්‍ය විෂය පථයට අයත් අනුබද්ධිත ආයතනයන්හි පනත් කාලීනව සංශෝධනය කිරීම

ජනමාධ්‍ය විෂය පථයට අයත් වන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය, සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ලේක්හවුස්), ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය හා ශ්‍රී ලංකා පදනම් ආයතනය යන ආයතන නීත්‍යානුකූලව පිහිටුවා ඇති පනත් හා සාංගමික ව්‍යවස්ථාවලි මීට වසර 40 කට පමණ පෙර එවකට පැවති ආර්ථික, සාමාජීය හා සංස්කෘතික අවශ්‍යතාවයන්ට ගැලපෙන ලෙස සකස් කර ඇති අතර මෑත කාලයේදී කිසිදු සමාලෝචනයකට ලක්කර නොමැත. එසේම, තැපැල් දෙපාර්තමේන්තුව, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතන තමන්ගේ දෛනික

රාජකාරී වලදී භාවිතා කරන අණ පනත්ද මීට දශක 05 කට පමණ පෙර සම්මත කර ඇති අණ පනත් වේ. කාලීන අවශ්‍යතාවයන්ට අනුගත වෙමින් පෞද්ගලික මාධ්‍ය හා සමාන කාර්යය හා සේවාවන් කරනු ලබන පෞද්ගලික ආයතන තරඟකාරී ලෙස ඉදිරියට පැමිණ ඇතිමුත් යල් පැනගිය පනත් හා නීතිරීති තුළ සිරවී සිටීමට සිදුවීම හේතුවෙන් රාජ්‍ය මාධ්‍ය හා රාජ්‍ය ආයතනවල ඉදිරි ගමන මන්දගාමී වී ඇත.

එසේම, ඩිජිටල් තාක්ෂණය සමඟ මතුවිය හැකි ඉදිරි ගැටලු සඳහා අනාගතයට ගැලපෙන ලෙස මෙම අමාත්‍යාංශ විෂය පථයට අයත්ව ඇති අණපනත් සංශෝධනය විය යුතුව ඇති අතර ශීඝ්‍රයෙන් වෙනස් වන තාක්ෂණික සමාජ රුචිකත්වයට ගැලපෙන ලෙස කටයුතු කරමින් මාධ්‍ය ක්ෂේත්‍රයේ පවත්නා දැඩි තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දී එය ජයගැනීමට හැකියාව ලැබෙන ලෙසත්, ස්වාධීන නැඟී සිටීමට අවශ්‍ය වන ආයතනික ව්‍යුහයන් සකස් කරගැනීමට අවකාශ සැලසීමටත්, ඒ සඳහා ගැලපෙන ලෙසත් දැනට පවත්නා අණ පනත් සංශෝධනය කිරීම ආරම්භ කර ඇත.

ජනමාධ්‍ය විෂය පථයට අයත් අනුබද්ධිත ආයතනයන්හි පනත් කාලීනව සංශෝධනය කිරීමේ කාර්යයෙහි ප්‍රගතිය

(අ) 1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම් පනත සංශෝධනය කිරීම

අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව පනත සංශෝධනය සඳහා 2024.04.01 දින නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත. ඒ අනුව, සංශෝධිත මූලික කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් 2024.09.18 දින අමාත්‍යාංශයට යොමු කරමින් ඉදිරි කටයුතු සඳහා වර්තමාන අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියක් අවශ්‍ය බව දන්වා ඇත. මේ සම්බන්ධව ශ්‍රී ලංකා පදනම් ආයතනයේ වත්මන් පාලක මණ්ඩලයද දැනුවත් කරමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

(ආ) 1973 අංක 05 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීම

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත මුද්‍රිත මාධ්‍ය සඳහා පමණක් අවශ්‍ය වන පරිදි සංශෝධනය කිරීම සඳහා අවධානය යොමු කරමින් කෙටුම්පත් කරන ලද පනත 2023.10.31 දින අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා තීරණය වූයේ කරන ලද සංශෝධන සම්බන්ධයෙන් එකී අවස්ථාවේ ඉදිරි කටයුතු නොකළ යුතු බවයි.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය පනත සංශෝධනය කාලීන අවශ්‍යතාවයක් වන බැවින් නැවත අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීමට පියවර ගනිමින් පවතී.

(ඇ) තැපැල් දෙපාර්තමේන්තු පනත් සංශෝධනය කිරීම

- **1989 අංක 09, 1943 අංක 23, 1952 අංක 56, 1958 අංක 46 දරන පනත් මඟින් සංශෝධිත 1931 අංක 01 දරන තැපැල් කාර්යාල ඇප අරමුදල ආඥා පනත - 473 අධිකාරය සංශෝධනය කිරීම**

පනත් සංශෝධනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. මේවන විට නීති කෙටුම්පත් සම්පාදක විසින් පනත් කෙටුම්පත සඳහා අවශ්‍ය සංශෝධනයන් සිදුකරමින් පවතී. එහි ඉදිරි කටයුතු සඳහා වර්තමාන අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අවශ්‍ය බව 2024.10.01 දිනැති ලිපිය මඟින් නීති කෙටුම්පත් සම්පාදක අමාත්‍යාංශයට දන්වා ඇත. ඒ අනුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදු වෙමින් පවතී.

- **1955 අංක 31, 1957 අංක 24 දරන පනත මඟින් සහ 1973 අංක 06 දරන නීතියෙන් සංශෝධිත 1908 අංක 11 දරන තැපැල් කාර්යාල ආඥා පනත - 190 අධිකාරය සංශෝධනය කිරීම**

තැපැල් කාර්යාල ආඥා පනත සංශෝධනය කිරීමේ කමිටුව විසින් තැපැල් ආඥා පනතේ වගන්ති 88 ක් සාකච්ඡා කර ඇතුළත් විය යුතු සංශෝධනයන් ද සැලකිල්ලට ගෙන අවසාන කෙටුම්පත සකස් කර ඇත. අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ.

(ඇ) ශ්‍රී ලංකා වරලත් ජනමාධ්‍යවේදී ආයතනය - Chartered Institute of Media Professionals – Sri Lanka යන නමින් ජනමාධ්‍ය වෘත්තීමය ආයතනයක් පිහිටුවීමේ පනත් කෙටුම්පත සැකසීම

ඉහළ වෘත්තීය නිපුණතා සහිත මාධ්‍ය වෘත්තිකයන් බිහිකිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවීම සඳහා සැකසූ පනත් කෙටුම්පත සඳහා 2022.08.23 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. මේ සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ ඇතුළත් කරමින් අවසන් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් මේ වන විට කෙටුම්පත් කරමින් පවතී. කෙසේ වෙතත් මෙම පනතේ කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා වර්තමාන අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගන්නා ලෙස නීති කෙටුම්පත් සම්පාදක 2024.10.10 දිනැතිව දන්වා ඇති අතර ඒ අනුව අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.

(ඉ) විද්‍යුත් විකාශන නියාමන කොමිෂන් සභා පනත (Establishment of the Broadcasting Regulatory Commission Act)

භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස උපරිමයෙන් සුරක්ෂිත කරමින් ප්‍රශස්ත මාධ්‍යකරණයක් තහවුරු කිරීමේ අරමුණින් විද්‍යුත් මාධ්‍ය සඳහා 'විද්‍යුත් විකාශන නියාමන කොමිෂන් සභා පනතක් හඳුන්වාදීම' සඳහා කෙටුම්පත් කරන ලද පනත සඳහා 2023.11.28 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව අවසන් කෙටුම්පත සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමුකර ඇත. ඒ අනුව සකස් කරන ලද මූලික කෙටුම්පත නිරීක්ෂණ සඳහා නීතිපති වෙත යොමුකර ඇති අතර නීතිපතිගේ නිරීක්ෂණ 2024.11.01 වන දින නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමුකර ඇත.

එසේම, යෝජිත විකාශන නියාමන කොමිෂන් සභා පනතට සමගාමීව 1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත සහ 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත සංශෝධනය කළ යුතු නිසා එම කෙටුම්පත් කාර්යයද නීතිකෙටුම්පත් සම්පාදක ආරම්භ කර ඇත. ඉහත පනත් දෙකෙහි ඉදිරි කෙටුම්පත් කාර්යය සඳහා නව අමාත්‍ය මණ්ඩල අනුමැතියක් අවශ්‍ය බව නීති කෙටුම්පත් සම්පාදක විසින් දන්වා ඇත.

(ඊ) චිත්‍රපට සංස්ථා පනත සංශෝධනය කිරීම

චිත්‍රපට කර්මාන්තය ගැටලු රැසකට මුහුණ දී ඇති අතර කර්මාන්තය නැවත නගා සිටුවීම සඳහා නියාමන කාර්යයේ නියැලෙන ස්වාධීන ආයතනයක් ස්ථාපිත කිරීම සඳහා 'ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංවර්ධන කොමිසම' පනත කෙටුම්පත් කරන ලදී. එම මූලික කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදුව. 'ජාතික චිත්‍රපට සංවර්ධන කොමිෂන් සභාව' යන නාමය වෙනුවට 'Film Sri Lanka' යන නාමයෙන් ආයතනයක් ස්ථාපිත කිරීම සඳහා 2024.07.30 අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබී ඇත.

අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මූලික කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත 2024.08.06 වන දින ඉදිරිපත් කරන ලදී. පනත් කෙටුම්පතෙහි ඉදිරි කෙටුම්පත් කාර්යය සඳහා වර්තමාන අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියක් අවශ්‍ය බව නීති කෙටුම්පත් සම්පාදක විසින් දන්වා ඇත.

2.1.22 ප්‍රසිද්ධ රඟහළ් පාලක මණ්ඩලය

ලාංකීය සමාජයට බලපාන ප්‍රසිද්ධ රඟ දැක්වීම් සම්බන්ධයෙන් වන දේශීය චිත්‍රපට, නාට්‍ය සහ සියළුම මහජන සංදර්ශන ප්‍රසිද්ධ රඟහළ් පාලක මණ්ඩල පනත යටතේ මහජන ප්‍රදර්ශනය සඳහා සුදුසු ද යන්න දැක්ම අනුව විමර්ශනය කෙරේ.

2024 වසර තුළ නිරීක්ෂණය කළ මුළු චිත්‍රපට සංඛ්‍යාව 216කි. වේදිකා නාට්‍ය සංඛ්‍යාව 306 කි. නිරීක්ෂණය කළ මුළු DVD සංඛ්‍යාව 90 ක් වන අතර සංගීත ප්‍රසංග සංඛ්‍යාව 642 කි.

2024 වර්ෂය සඳහා ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් ලෙස භාණ්ඩාගාරයෙන් රු. මි. 19 ක් ලබාදී ඇත. වියදම රු.මි. 14.30 ක් වන අතර උපයෝජනය 75% කි. 2024 වසරේදී බලපත්‍ර නිකුත් කිරීම මගින් උපයාගන්නා ලද මුළු ආදායම රුපියල් මිලියන 10.18 කි. Digital Cinema Package (DCP) යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය මූලික වැඩ කටයුතු අවසන් කර ඇත. නව සිනමා ශාලාවේ නවීකරණ කටයුතු නිම කර ඇති අතර, තිරය සහ ශබ්ද පද්ධතිය ස්ථාපිත කර ඇත.

2.1.23 ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී විකාශනය අංකිත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

භෞමික රූපවාහිනී විකාශනය ප්‍රතිසම (Analog) ක්‍රමවේදයේ සිට අංකිත (Digital) ක්‍රමවේදය දක්වා ගමන් කරන ගෝලීය ප්‍රවණතාවයට ශ්‍රී ලංකාව ද අනුගත විය යුතුය. වර්තමානයේ පවත්නා තාක්ෂණය ක්‍රමයෙන් යල්පැන තත්ත්වයට පත්ව විකාශන පද්ධතිය නඩත්තු කිරීම හා අතිරේක රූපවාහිනී නාලිකා අවශ්‍යතාව සපුරාලීමේ අභියෝගයන්ට මුහුණපෑමට සිදුවී ඇත. ඉතාම කාර්යක්ෂම අංකිත (Digital) තාක්ෂණය පවතිද්දී තවදුරටත් ප්‍රතිසම (Analog) තාක්ෂණය භාවිතයෙන් සංඛ්‍යාත පරාසය (frequency spectrum) අපතේ යාමක් සිදුවන අතර එම සංඛ්‍යාත පරාස අනෙකුත් විදුලි සංදේශ සේවාවන්ට යොදා ගැනීමට ඇති හැකියාව මහ හැරී යනු ඇත.

බොහෝ රටවල් අංකිත තාක්ෂණය වෙත අවතීර්ණ වන බැවින් ප්‍රතිසම (Analog) උපාංග (Transmitter) විදේශීය වෙළෙඳපොල තුළ නිෂ්පාදනය නොවේ. එබැවින් අදාළ සන්නිවේදන උපකරණ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි විශාල පිරිවැයක් දරා නිෂ්පාදන ආයතන වෙතින් නිෂ්පාදනය කර ගත යුතුය. එමෙන්ම මෙම උපාංගවල නඩත්තු කටයුතු සහ වැඩිදියුණු කිරීම් සඳහා දල නව උපාංග මිලදී ගැනීමේදී විදේශ විනිමය විශාල ප්‍රමාණයක් වැය කිරීමට සිදුවීමද, සියලුම මාධ්‍ය ආයතන මෙන්ම රජය ද මුහුණදෙන විශාල අභියෝගයකි. තවද, මෙම සන්නිවේදන උපකරණවල විදුලි පිරිවැය ඉතා ඉහළ බැවින් තවදුරටත් මෙම සේවය මෙලෙසින්ම පවත්වාගෙන යාම සේවා ආයතනවල පිරිවැය ඉහළ යාමට හේතු වේ.

එමෙන්ම, ගාස්තු අයකර රූපවාහිනී සේවාවන් ලබා දෙන ආයතන තිබුණද, එම රූපවාහිනී ආයතනවල ගෙවීම් ස්වභාවය මත බහුතර පවුල් ඒකක තවමත් ප්‍රතිසම සේවාවන් තුළ රැඳී සිටී.

2009 වර්ෂයේදී DVB - T තාක්ෂණය හා 2010 වසරේ දී DVB – T2 තාක්ෂණය යටතේ දැනට පවත්නා ප්‍රතිසම (Analog) භෞමික රූපවාහිනී විකාශනය අංකිත (Digital) භෞමික රූපවාහිනි විකාශනය දක්වා පරිවර්තනය කිරීම ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය මෙන්ම විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ද, විවිධ ක්‍රියාමාර්ග සහ සාධනීය පියවර කිහිපයක් ගෙන තිබුන ද, ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන නොවූ බැවින්, එය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

2009 වසරේ පළමු අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කළ දින සිට අංකිතකරණ (Digitalization) ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ මුලිකත්වය ගෙන ක්‍රියා කරන ලද්දේ ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය වන අතර, තාක්ෂණික ප්‍රමිතීන් ස්ථාපිත කරමින් අංකිතකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා වන අංකිතකරණ විකාශන සැලැස්ම (Digital Broadcasting Road Map) සකස් කිරීම සඳහා පූර්ණ සහයෝගය ලබාදෙන ලද්දේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසිනි.

ඒ අතරතුර, ජපාන, JICA ආයතනය යටතේ කරන ලද ශක්‍යතා අධ්‍යයනයකින් අනතුරුව, ශ්‍රී ලංකාවට ගැලපෙන ලෙස ජපාන ISDB - T තාක්ෂණය සකස් කිරීම පිණිස යෝජනා විය. ඒ අනුව, ඩිජිටල්කරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස 2014 සැප්තැම්බර් මස 23 වන දින ශ්‍රී ලංකා රජය විසින් ජපාන සහන ණය ගිවිසුමකට (Soft Loan Agreement) අවතීර්ණ වෙමින් 2014 ඔක්තෝබර් මාසයේදී, ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය විසින් එහි කටයුතු ආරම්භ කරන ලදී.

2021 වසරේ දෙසැම්බර් මස අවසන් වීමට නියමිතව තිබූ මෙම ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක නොවූ බැවින් එවකට ජනාධිපතිතුමා තාක්ෂණ අමාත්‍යවරයා ලෙස හා ගරු ජනමාධ්‍ය අමාත්‍යතුමා ඒකාබද්ධව යොමු කළ 'ජපාන ණය ආධාර යටතේ ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී විකාශනය අංකිත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම (SL -P112)' යන මැයෙන් වූ 2021 අප්‍රේල් 01 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමප/21/0621/316/016 හා 2021.04.28 දිනැති අමාත්‍ය මණ්ඩලය එළැඹී තීරණය මගින් මෙම ව්‍යාපෘතිය යාවත්කාලීන කරන ලද තාක්ෂණය සමග ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි විය.

අංකිත (Digital) තාක්ෂණයට අනුගත වීම මගින් රජයට අත්වන විශාලතම ප්‍රතිලාභය වන්නේ වර්තමානයේ භාවිතා වන සංඛ්‍යාත පරාසයෙන් (Frequency Spectrum) වැඩි ප්‍රමාණයක් මුදා හැරීමට ඇති හැකියාවයි. එබැවින් එම සංඛ්‍යාත පරාසය 5G නිරූහැන් පුළුල් පරාස (Broadband) සේවා සඳහා භාවිතා කිරීමට හැකිවන අතර, මෙමඟින් නවීනතම තාක්ෂණය ග්‍රාමීය ප්‍රදේශවලට ගෙනයාම පහසු වනු ඇත. තවද, අනාගතයේදී රූපවාහිනී නාලිකා ප්‍රමාණය වැඩි කර ගැනීමට ද හැකියාව ලැබේ.

සියලු විකාශන මෙහෙයුම්කරුවන් විසින් පවත්වාගෙන යනු ලබන තනි විකාශන ජාල වෙනුවට, අංකිත (Digital) විකාශන ජාල මෙහෙයුම්කරු (Digital Broadcast Network Operator - DBNO) ලෙස තනි මෙහෙයවන්නෙකු ස්ථාපිතවීම රූපවාහිනී විකාශකයා ලබන වාසියකි.

එමෙන්ම යල්පිනු ප්‍රතිසම තාක්ෂණය භාවිතා කරනු ලබන විකාශනාගාර නඩත්තුව සඳහා විශාල මුදලක් වාර්ෂිකව වැය කිරීමට විකාශන ආයතනවලට සිදු වන අතර, ව්‍යාපෘතිය අවසන් වූ පසු ඔවුන්ට තනි තනිව විකාශන ජාල නඩත්තු කිරීමට අවශ්‍ය නොවන අතර, මෙමඟින් නඩත්තු පිරිවැය ද විශාල ලෙස අඩුවනු ඇත.

ප්‍රතිසම (Analog) ක්‍රමවේදයේ අත්විඳිනු ලබන දුර්වල සංඥා ලැබීම වෙනුවට ඉතා උසස් අංකිත (Digital) රූප රාමු නැරඹීමට ඇති හැකියාව, තනි තනි රූපවාහිනී නාලිකා වෙනුවට සියලු රූපවාහිනී නාලිකා සඳහා එක් ඇන්ටනාවක් නිවසෙහි ස්ථාපිත කිරීම ප්‍රමාණවත් වීම, සියලු දේශීය නාලිකා එක සමාන තත්ත්වයෙන් රසවින්දනය කිරීමේ හැකියාව සහ කිසිදු ගෙවීමකින් තොරව අධි විස්තෘත (High Definition - HD) රූපවාහිනී නැරඹීමේ අත්දැකීම ලැබීම ප්‍රේක්ෂකයා වෙත ලැබෙන ප්‍රධාන ප්‍රතිලාභය වේ.

මෙම ව්‍යාපෘතියට අදාළ සියළු මෙහෙයුම් කටයුතු හා කොළඹ ඇතුළු බස්නාහිර පළාත තුළ විකාශන කටයුතු කොළඹ නෙලුම් කුළුණ කේන්ද්‍රකොට ගෙන සිදු කිරීමට නියමිතය.

මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය ජපන් යෙන් මිලියන 17,717 කි. (JICA ආයතනයේ දායකත්වයේ වටිනාකම ජපන් යෙන් මිලියන 13,717 ක් ද, රජයේ දායකත්වය ජපන් යෙන් මිලියන 3,505 ක් ද වශයෙනි.) ව්‍යාපෘතිය නිළ වශයෙන් එළිදැක්වීමේ සමාරම්භක උළෙල 2021.12.28 දින ගරු ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

2024 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘතියේ ප්‍රගතිය

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ස්ථාපිත කර, 2021.07.15 දින මෙම ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කටයුතු ආරම්භ කරන ලදී.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2014.06.05 දින අනුමත කරන ලද කාර්යය මණ්ඩලයේ තනතුරු 27 න් තනතුරු 02 ක් හැර අනෙකුත් තනතුරු 25 සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට සැලසුම් කළද 2021.08.23 දින එම දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී ඇත්තේ 05 දෙනෙකුගෙන් යුත් කාර්යය මණ්ඩලයක් සඳහා පමණි. එසේ වුවද, පසුගිය සමයේ ආර්ථික අර්බුදය හේතුවෙන් සංවර්ධන ව්‍යාපෘතිවල ව්‍යාපෘති කාර්යාල සහ කළමනාකරණ ඒකක සමාලෝචනය කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ නිර්දේශ සම්බන්ධයෙන් වන ජාතික මෙහෙයුම් මැදිරි කමිටු (NOR) වාර්තාවේ සඳහන් නිර්දේශය පරිදි ව්‍යාපෘතියේ කටයුතු දෙදෙනෙකුගෙන් යුත් කාර්යය මණ්ඩලයක් මඟින් සිදු කරමින් පවතී.

i. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ඉංජිනේරු උපදේශන සේවා ලබා ගැනීමට JICA ආයතනයේ එකඟතාව මත ජපන් උපදේශන සේවා ආයතනයක් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද උපදේශන ප්‍රසම්පාදන කමිටුවක් (CPCC) විසින් තෝරා ගෙන ඇත. ඒ අනුව 2022.08.08 දින අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව එවකට රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් JICA ආයතනය සියලුම ජපන් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබා දීම තාවකාලිකව නවතා තිබූ හෙයින් එය නැවත ආරම්භ කල පසු ඉංජිනේරු උපදේශක සේවා සැපයීමේ කොන්ත්‍රාත්තුව පිරිනමන ලෙස අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇත.

ii. 2022 අප්‍රේල් මාසයේ සිට තාවකාලිකව අත්හිටුවන ලද ව්‍යාපෘතිය 2024 ජූලි මාසයේ සිට නැවත ආරම්භ කිරීමට අදාළ උපදෙස් 2024.07.26 දිනැති අග්‍රාමාත්‍ය කාර්යාලයේ ලිපිය මඟින් ලැබී ඇත. තවද, එම ලිපිය මඟින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යම් බාධාවන් ඇත්නම්, ඒ පිළිබඳව දැනුවත් කරන ලෙස ද දන්වා ඇත. ඒ අනුව, මෙම අමාත්‍යාංශය විසින් 2024.08.23 දිනැතිව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උපදෙස් විමසා ලිපියක් ජාතික මෙහෙයුම් මැදිරිය වෙත ඉදිරිපත් කළ අතර එහි සභාපතිවරයා විසින් උපදේශක ආයතනය සමඟ ගිවිසුම්ගතව උපදේශක සේවා ආරම්භ කිරීමට අවශ්‍ය අනුමැතිය අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දී ඇති බැවින් ඒ අනුව කටයුතු කරන ලෙස දන්වා ඇත.

2024.10.04 දිනැතිව අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් ව්‍යාපෘතිය ඇගයීම සඳහා විශේෂ කමිටුවක් පත් කිරීමට අනුමැතිය ලබා ගෙන ඇත. එම කමිටුව විසින් සකස් කරන ලද වාර්තාව 2024.12.30 දින අදාල අංශ වෙත භාර දී ඇති අතර ඒ අනුව, ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.

iii. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු වලට සමගාමීව මෙම ව්‍යාපෘතිය තුළින් දැනට පවතින ප්‍රතිසම (Analog) විකාශන කටයුතු නිමාවීමත් සමඟ නව අංකිත (Digital) පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට, දැනට රටතුළ පවතින අදාළ නීති පද්ධතිය මුලුමනින්ම සංශෝධනයට ලක්විය යුතුය. ඒ අනුව මෙම නීති කෙටුම්පත්

සම්මත කර අවසානයේ ඩිජිටල් විකාශන ජාල මෙහෙයුම්කරු (DBNO) යන ආයතනය පිහිටුවීමට අවස්ථාව සැලසෙනු ඇත. ඒ අනුව මේ වන විට අමාත්‍යාංශය විසින් පත් කළ කමිටුවක් විසින් පනත කෙටුම්පත් කරමින් පවතී.

iv. යෝජනා වී ඇති පරිදි රටපුරා විසිරී පවතින විකාශනාගාර 16 ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය ඉඩම් පවරා ගැනීම ද, මෙම ව්‍යාපෘතියේ මුල් අවධියේ උපදේශක සේවා ආරම්භ කිරීමට ප්‍රථමව කළ යුතුව ඇත. ඒ අනුව, මේ වන විට ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ස්වාධීන රූපවාහිනී සේවය හා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමඟ අත්සන් කිරීමට නියමිත අවබෝධතා ගිවිසුම් කෙටුම්පත් එම ආයතන වෙත යොමුකර ඇත. අනෙකුත් ඉඩම් පවරා ගැනීම් සඳහා අවශ්‍ය කටයුතුද, සම්පාදනය කරමින් පවතී.

v. මෙම ව්‍යාපෘතියට අදාළව ජපානය විසින් 2023.07.12 ලබා දුන් තාක්ෂණික ප්‍රමිතීන් සම්බන්ධ විස්තර ඇතුළත් වාර්තාව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීමට ලක් කර ඇත. එම ඇගයීමේ දී හඳුනාගත් කරුණු ඇතුළත් වාර්තාවක් ජපාන තානාපති කාර්යාලය වෙත යොමු කර ඇත. ඔවුන්ගේ නිරීක්ෂණ ලද පසු එම නිරීක්ෂණද සැලකිල්ලට භාජනය කරමින් තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව සකස් කරනු ඇත.

vi. 2024 ජූලි මාසයේ අවසන් වන තුරු JICA ආයතනය ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන පහසුකම් ආරම්භ කර නොතිබූ බැවින්ද එතෙක් පටන් වසර අවසන් වන තුරුත් ඉංජිනේරු උපදේශන සේවා ආයතනය සමඟ ගිවිසුම්ගත වීම සිදු නොවීමත් මූලික ව්‍යාපෘති කටයුතු කාර්යය මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙක් මගින් සිදුකිරීමත් හේතුවෙන් මේ දක්වා ව්‍යාපෘති පිරිවැය අවම මට්ටමක පවතී. ඒ අනුව 2024 වසර වෙනුවෙන් දේශීය ප්‍රතිපාදන රු.මි. 50 ක් හා විදේශීය ප්‍රතිපාදන රු.මි. 100 ක් ලබා දී ඇති අතර 2024 දෙසැම්බර් 31 දින දක්වා වියදම රු.මි. 6.9 කි.

2.2 අභියෝග

2.2.1 අලාභ මත පවත්වාගෙන යනු ලබන මාධ්‍ය ආයතන ලාභ ලබන ආයතන බවට පත් කිරීම

පෞද්ගලික මාධ්‍ය මෙන් නොව සංස්කෘතිය ආරක්ෂා කිරීම මෙන්ම සමාජ සාරධර්ම ද ආරක්ෂා කරමින් කටයුතු කිරීම රාජ්‍ය මාධ්‍ය ආයතන සතු වගකීමයි. එතෙකුදු වුවද, වර්තමානයේ පවතින තරඟකාරීත්වය සමඟ නාලිකාවක ගුණාත්මකභාවය වෙනුවට අවධිමත් විකාශන වර්ගීකරණයට යටත්ව විකාශන නාලිකා සඳහා දැන්වීම් සැපයීම හේතුවෙන් පුනරාවර්තන වියදම් පියවා ගැනීමට පවා රාජ්‍ය මාධ්‍ය ආයතන උපයන ආදායම ඔවුන්ට ප්‍රමාණවත් නොවේ. ජාතික න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහන් නිෂ්පාදනය කිරීම, විකාශය සහ තරඟකාරීත්වය සඳහා වැඩසටහන් නිෂ්පාදනය කිරීම හා විකාශය පරස්පර විරෝධී සාධක දෙකකි. මෙම ආයතන පාඩු ලැබීමට ප්‍රධාන සාධකය දරාගත නොහැකි මෙහෙයුම් කාර්ය වියදමයි. මෙම ආයතන අවම වශයෙන් සමායන ලක්ෂ්‍යයේ හෝ පවත්වා ගැනීමට ප්‍රතිව්‍යුහගත කළ යුතුය.

2.2.2 ශ්‍රී ලංකාවේ රූපවාහිනී විකාශන කටයුතු සඳහා අංකිත (Digital) තාක්ෂණය හඳුන්වා දීම

ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන ප්‍රතිසම (Analog) තාක්ෂණය වෙනුවට ලෝකයේ බොහෝ රටවල් විසින් නව තාක්ෂණික තත්ත්වයන් යටතේ වැඩිදියුණු කරන ලද ඩිජිටල් තාක්ෂණය රූපවාහිනී ක්ෂේත්‍රය සඳහා හඳුන්වාදීම කාලීන අවශ්‍යතාවයක් වී ඇත. විශේෂයෙන්ම ප්‍රතිසම තාක්ෂණය ඉවත් වෙමින් පැවතීම නිසා එකී තාක්ෂණය මත පවත්නා විකාශන උපකරණ ඉදිරියේදී නඩත්තු කිරීම ගැටළු සහගතවේ. මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය සපයා ගැනීම සහ 2028 ඉලක්කගත වර්ෂය වන විට අවසන් කිරීම හා ඒ සඳහා පෞද්ගලික මාධ්‍ය ආයතන සම්බන්ධ කර ගැනීම අභියෝගාත්මකය.

2.2.3 ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම

වර්තමානයේදී, ආර්ථික, සමාජීය සහ දේශපාලනික භූමිකාවන්හි ඉතාම ශක්තිමත් හා තීරණාත්මක සාධකයක් බවට ජනමාධ්‍ය පත්ව තිබේ. ජනතාව වෙත තොරතුරු සමීප කරලීම පිණිස ජනමාධ්‍ය ධනාත්මක දායකත්වයක් සපයන අතර එමඟින් යහ පාලනය පවත්වාගෙන යාමට සහාය වේ.

ශ්‍රී ලංකාවෙහි ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම සහතික කිරීමේදී නිදහස්, ස්වාධීන සහ ජනතා හිතකාමී මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැගීම වැදගත් වේ. මෙකී කර්තව්‍යය උදෙසා, යහ පාලනයත් ප්‍රජාතාන්ත්‍රවාදයත් පිළිබඳ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමෙහිලා ජනමාධ්‍යවේදීන්ගේ පාර්ශවයෙන් විශාල දායකත්වයක් අපේක්ෂා කෙරෙන අතර එබැවින්, රට තුල විවෘත මාධ්‍ය සංස්කෘතියක් ස්ථාපිත කිරීම සඳහා වෘත්තීය වශයෙන් බලගැන්වුනු ජනමාධ්‍යවේදී ප්‍රජාවක් පැවතිය යුතුය. පසුගිය දශක දෙක පුරාම, වෘත්තීය මාධ්‍යවේදීන් ජනිත කිරීමේ ආයතනයක් ස්ථාපිත කිරීමේ ප්‍රයත්නය සාර්ථක වී නොමැත. ජනමාධ්‍ය සමාජයට වගකිවයුතු වන නිසාම, ඉහළම මාධ්‍ය ප්‍රමිතීන් පවත්වාගෙන යාම සහතික කරමින් අදාළ මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූලව වෘත්තීය මාධ්‍යවේදීන් බිහිකිරීම මගින් අත්‍යන්ත මාධ්‍ය භාවිතයේ විශිෂ්ටත්වය සාක්ෂාත් කරගැනීමේ සමාජ වගකීම ඉටුකරන ජාතික ආයතනයක් පිහිටුවිය යුතුවේ.

නවීන තාක්ෂණයේ දියුණුව හා ගෝලීය ප්‍රවණතා හේතුවෙන් ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ නිරන්තර වෙනස්කම් සිදු වෙමින් පවතින අතර, එවැනි වෙනස්කම් සිදු කිරීමේදී වෘත්තීය සංවර්ධනය, ධාරිතාව ඉහළ නැංවීම සහ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අඛණ්ඩ අධ්‍යාපන ආයතනයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත. ඒ අනුව, යෝජිත මාධ්‍ය ආයතනය පිහිටුවීම අතිශයින් වැදගත් වේ.

2.2.4 අපක්ෂපාතී විකාශන ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම

ගුවන් විදුලි හා දැන්වීම් ප්‍රචාරයේදී විකාශන ශ්‍රේණිගත කිරීම තීරණාත්මක සාධකයක් ලෙස බලපායි. විකාශන මධ්‍යස්ථානයන්හි වැඩසටහන් පෙළගැස්මේ සිට අන්තර්ගතයන් දක්වා බලපෑමකට ලක් කර ආර්ථික ශක්‍යතාවය අසමානුපාතික ලෙස පාලනය කිරීමේ හැකියාවක් ශ්‍රේණිගත කිරීම් දත්තවලට ඇත. රාජ්‍ය ගුවන් විදුලි හා රූපවාහිනී නාලිකා පමණක් ක්‍රියාත්මකව තිබූ අවධියේ ශ්‍රේණිගත කිරීම් සිදු නොවූ අතර 1992 දී විකාශන ක්ෂේත්‍රයේ සීමා ලිහිල් කිරීමෙන් අනතුරුව පෞද්ගලික සමාගම්වලට ඉඩ ප්‍රස්ථාව ලබාදී වසර කිහිපයකට පසුව ශ්‍රේණිගත කිරීම ආරම්භ විය. දැන්වීම්කරුවන් විසින් මෙම ශ්‍රේණිගතකිරීම් පුළුල් ලෙස භාවිතා කළද ගුණාත්මකභාවය අගයන රාජ්‍ය මාධ්‍ය ආයතන මෙම ක්‍රමවේදය පිළිබඳව තෘප්තිමත් නැත. එබැවින් අපක්ෂපාතී ශ්‍රේණිගත කිරීම් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වේ.

2.2.5 විකාශන නියාමන පනත හඳුන්වාදීම

තාක්ෂණික සහ නෛතික ස්ථරයන්හි සිදුවෙමින් පවත්නා වූ වෙනස්කම් හා නිකුත් කරන ලද බලපත්‍රයන්හි පවත්නා ගැටළුකාරීභාවය මෙන්ම අතීතයේදී යම් අවස්ථාවන්හිදී මාධ්‍ය වල හැසිරීම පාදක කොට ගනිමින් රාජ්‍ය හා පුද්ගලික යන මාධ්‍ය ආයතන දෙපාර්ශවයම හැසිරවීම උදෙසා යම් ස්වාධීන ආයතනයක් පැවතිය යුතු බවට නිරීක්ෂණය විය.

2.2.6 රාජ්‍ය මාධ්‍ය ආයතනයන්හි තාක්ෂණික තනතුරු සඳහා නවකයින් ආකර්ෂණය නොවීම.

2.2.7 රාජ්‍ය මාධ්‍ය ආයතන නවීන තාක්ෂණයෙන් සවිබල ගැන්වීම.

2.2.8 සමාජ මාධ්‍යවල අනිසි බලපෑම

2.3 අනාගත ඉලක්ක

i. මාධ්‍ය නිදහස තහවුරු වන පරිදි වගකීම් හා වගවීම් සහිත මාධ්‍ය සදාචාරයක් බිහිකිරීම සඳහා අවශ්‍ය නියාමනයන් ක්‍රියාත්මක කිරීම.
ii. රටේ සියලු පුරවැසියන්ට තොරතුරු ලබාගැනීමේ ප්‍රවේශයන් පුළුල් කිරීම.
iii. මාධ්‍යවේදීන් දැනුමෙන් හා අත්දැකීමෙන් සන්නද්ධ කිරීම.
iv. මාධ්‍ය සාක්ෂරතාවය ඇති කිරීම.
v. මාධ්‍ය ප්‍රතිපත්තියක් හඳුන්වා දීම.
vi. මාධ්‍ය ආචාරධර්ම පද්ධතියක් හඳුන්වාදීම.



03 පරිච්ඡේදය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන

සමස්ත මූල්‍ය කාර්යසාධනය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024		සටහන	කණ්ඩායම 2024	2023	
රු.			රු.	රු.	
185,000,000	ආදායම් ලැබීම්		**123,750,000**	150,450,000	
-	ආදායම් බදු	1	-	-	
185,000,000	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	123,750,000	150,450,000	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
185,000,000	**මූල ආදායම් ලැබීම් (අ)**		**123,750,000**	150,450,000	
-	ආදායම් නොවන ලැබීම්		**187,869,016**	564,219,386	
-	භාණ්ඩාගාර අග්‍රිම		175,358,000	553,043,000	ඒසිඒ-3
-	තැන්පතු		1,579,514	946,670	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		10,931,502	10,229,716	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මූල ආදායම් නොවන ලැබීම් (ආ)**		**187,869,016**	564,219,386	
-	**මූල ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**311,619,016**	714,669,386	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		4,365,924	6,164,264	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		307,253,091	708,505,123	
	අඩු කළා : වියදම්				
638,395,000	**පුනරාවර්තන වියදම්**		**543,576,723**	827,214,875	
138,170,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	119,612,871	114,635,419	
137,900,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	81,169,803	87,700,038	ඒසිඒ-2(ii)
362,325,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	342,794,049	624,856,830	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	22,588	
638,395,000	**මූල පුනරාවර්තන වියදම් (ඊ)**		**543,576,723**	827,214,875	
432,500,000	**මූලධන වියදම්**		**185,723,028**	144,918,430	
31,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	19,907,853	24,190,683	
6,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	3,861,699	5,956,540	
216,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	151,120,978	53,393,575	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
4,500,000	හැකියා වර්ධනය	14	3,926,278	3,424,493	
175,000,000	වෙනත් මූලධන වියදම්	15	6,906,221	57,953,140	
432,500,000	**මූල මූලධන වියදම් (උ)**		**185,723,028**	144,918,430	
	තැන්පතු ගෙවීම්		7,478,223	1,870,110	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		10,690,378	11,692,556	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		18,168,601	13,562,666	
	මූල වියදම් එ = (ඊ+උ+ඌ)		747,468,351	985,695,972	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(440,215,260)	(277,190,849)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(440,616,526)	(277,190,849)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		401,266	-	ඒසිඒ-3
			(440,215,260)	(277,190,849)	

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තක්ෂ 2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියක හා උපකරණ	ඒසිඒ-6	405,270,240	401,408,541
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	17,700,319	17,941,443
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**422,970,559**	**419,349,984**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		15,965,991	10,709,671
දේපළ පිරියත හා උපකරණ සංචිතය		405,270,240	401,408,541
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**	-	-
ජංගම වගකීම්			
කැන්පතු ගිණුම්	ඒසිඒ-4	1,333,063	7,231,771
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	401,266	-
මුළු වගකීම්		**422,970,559**	**419,349,984**

පිටු අංක 7 සිට 42 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 43 සිට 48දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත.** ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2025.02.25	දිනය :	දිනය : 2025.02.24

ජේ.ආර්. දෙනවක
ප්‍රධාන මූල්‍ය නිලධාරි - ජනමාධ්‍ය
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
163, "ඇසිඩුසි මැදුර"
කිරුළපන මාවත, පොල්හේන්ගොඩ,
කොළඹ 05.

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	කණ්ඩායම	
	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	123,750,000	150,450,000
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	18,846,911	14,445,202
අග්‍රිම ලැබීම්	175,358,000	553,043,000
අත්තිකාරම් අයකර ගැනීම්	8,641,047	8,371,179
තැන්පතු ලැබීම්	1,579,514	946,670
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**328,175,473**	**727,256,052**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	237,594,604	337,737,054
සහනාධාර සහ මාරුකිරීම්	64,807,049	355,616,830
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	492,083	9,743,742
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	4,365,924	6,164,264
අත්තිකාරම් ගෙවීම්	9,174,624	10,167,512
තැන්පතු ගෙවීම්	7,478,223	1,870,110
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**323,912,508**	**721,299,512**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**4,262,965**	**5,956,540**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	3,861,699	5,956,540
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**3,861,699**	**5,956,540**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(3,861,699)**	**(5,956,540)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	401,266	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	401,266	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	401,266	-

වාර්තාකිරීමේ පදනම

1) පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) මුදල් හා මුදල් සමාන දෑ

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිතවූ ගනුදෙනු ඇති අවස්ථාවලදී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකරගත හැක. එසේම, ‘‘වාර්තාකරණ පදනම’’ යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු. '000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුදල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
1002.13.00	ටෙලිනාට්‍යල චිත්‍රපට හා වානිජ වැඩසටහන් බද්ද	185,000	185,000	123,750	67%

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්යසාධනය

රු. '000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	628,900	638,395	543,577	85%
ප්‍රාග්ධන	422,500	432,500	185,723	43%
එකතුව	1,051,400	1,070,895	729,300	68%

3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. '000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදනල ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01.	මැතිවරණ කොමිසන් සභාව	2024 ජනාධිපතිවරණ මැතිවරණ කාර්ය මණ්ඩල ගෙවීම්	271	271	270	99%
02.	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	විශ්‍රාම ගිය නිලධාරීන්ගේ දේපල ණය ශේෂ නිරවුල් කිරීම	222	222	222	100%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. '000

වත්කම් කේතය	කේත විස්තරය	**2024.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**2023.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	57,533	57,533	-	100%
9152	යන්ත්‍රෝපකරණ	90737	90737	-	100%
9153	ඉඩම්	257,000	257,000	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපති වාර්තාව

කාර්යසාධන වාර්තාවේ අවසානයේ අමුණා ඇත.

04 පරිච්ඡේදය

කාර්යසාධන දර්ශක

කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

	විශේෂිතවූ දර්ශක	තත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස			
		100% - 90%	**75% -89%**	**50% - 74%**	**0% - 49%**
1	විකාශන නීතිය කෙටුම්පත් කිරීම	100%	-	-	-
2	තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන් දැනුම්වත් කිරීම	100%	-	-	-
3	වෘත්තීය මාධ්‍යවේදීන් බිහි කිරීම				
3.1	ඇසිදිසි ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන	100%	-	-	-
3.2	මාධ්‍යවේදීන් සඳහා උසස් අධ්‍යාපන ආයතනයක් ස්ථාපිත කිරීම සඳහා පනත කෙටුම්පත් කිරීම (ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය)	100%	-	-	-

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

වගකීම් සහගත මාධ්‍ය සංස්කෘතියක් බිහිකිරීම සඳහා පහසුකම් සලසන අතරතුර මාධ්‍ය ක්‍රියාකාරිත්වයෙහි විශිෂ්ටත්වය කරා ප්‍රවිශ්ට වීම.

අරමුණ/ පරමාර්ථය	ඉලක්කය (ගෝලීය ඉලක්කය)	සාක්ෂාත් කර ගැනීම සඳහා වන දර්ශක	වර්තමානය වන විට සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය		
			0%- 49%	50%- 74%	75%- 10%
4. ගුණාත්මක අධ්‍යාපනය	4.4 2030 වන විට රැකියා, සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වය සඳහා අවැසි තාක්ෂණික සහ වෘත්තීය නිපුනතා ද ඇතුලු අදාල නිපුනතා සහිත තරුණ සහ වැඩිහිටි ජනගහනය ක්‍රමිකව වැඩි කිරීම.	ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය (Chartered Institute of Media Professionals – Sri Lanka) පිහිටුවීම සඳහා පනත් කෙටුම්පත සකස් කිරීම.			100%
		ඇසි දිසි ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීම.			100%
16. සාමය යුක්තිය සහ ශක්තිමත් ආයතන	16.10 ජාතික නීතිය සහ ජාත්‍යන්තර ගිවිසුම් ප්‍රකාරව තොරතුරු වලට මහජනතාවට ප්‍රවේශ වීමේ හැකියාව සහතික කොට මූලික නිදහස තහවුරු කරලීම.	තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීම			
		අ) පුහුණුකරුවන් පුහුණු කිරීම			100%

		ආ) තොරතුරු නිලධාරීන් සහ රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම (අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධ සියලු ආයතන සඳහා)			100%
		ඇ) ජාත්‍යන්තර තොරතුරු දිනය වෙනුවෙන් වැඩමුළුවක් සංවිධානය			100%
		ඈ) තොරතුරු නිලධාරීන් සඳහා අත්පොත් මුද්‍රණය කර බෙදාහැරීම			100%

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ජයග්‍රහණ :

i. වෘත්තීය ජනමාධ්‍යවේදීන් ජනමාධ්‍ය ක්ෂේත්‍රයට බිහි කිරීමේ අරමුණින් ජාතික ජනමාධ්‍ය ආයතනයක් ස්ථාපිත කිරීම සඳහා වන ව්‍යාපෘති වාර්තාව මෙම අමාත්‍යාංශය මඟින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අතර එම දෙපාර්තමේන්තුව ප්‍රතිපත්තිමය වශයෙන් මෙම ව්‍යාපෘති සංකල්පයට එකඟතාවය පල කර ඇත. 2020.08.09 දින අංක 2187/27 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව තෘතීක අධ්‍යාපන ආයතනයක් වන ශ්‍රී ලංකා පදනම් ආයතනය මෙම අමාත්‍යාංශයීය විෂය පථය යටතට පත් කිරීමත් සමඟම එම ආයතනය සමඟ ඒකාබද්ධව ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයින්ගේ ආයතනය පිහිටුවීමට අවශ්‍ය පනත කෙටුම්පත් කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යොමු කර ඇත.

ii. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත ක්‍රියාත්මක කර එය සමාජගත කිරීමේ වගකීම මෙම අමාත්‍යාංශය විසින් දරනු ලබන අතර මෙම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමෙහිලා මේ සඳහාම වෙන්වූ ඒකකයක් අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇත. පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධ සියළු කටයුතු

මෙම ඒකකය හරහා සිදු කෙරේ. තවද 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි 11 වන වගන්තිය ප්‍රකාරව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව පොදු අධිකාරීන් සුපරීක්ෂණය කිරීමෙහි සහ තොරතුරු නීතිය බලාත්මක කිරීමේ ආයතනය වශයෙන් ස්ථාපිත කරන ලදී.

අභියෝග :

i. රාජ්‍ය ආයතන අතර සුසංයෝගයක් ඇති කර ගැනීම හරහා සාමූහික ක්‍රියාමාර්ග හඳුනා ගැනීම හා ඒකාබද්ධ සැලසුම්කරණයකට ප්‍රවිෂ්ඨ වීම.

ii. තාක්ෂණයේ ප්‍රගමනයත් සමඟ මාධ්‍ය ක්ෂේත්‍රයට සරිලන පරිදි රාජ්‍ය මාධ්‍ය ආයතන නවීන තාක්ෂණයෙන් සවිබල ගැන්වීම.

iii. මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා පෞද්ගලික මාධ්‍ය මෙන්ම සමාජ මාධ්‍ය කාර්යක්ෂමව යොදා ගැනීම.

iv. තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මාධ්‍ය සහය ලබාදීමට රාජ්‍ය මාධ්‍ය ආයතන සඳහා ප්‍රමාණවත් තරම් ප්‍රතිපාදන නොලැබීම.

v. අනුමත කාර්ය මණ්ඩලය සම්පූර්ණ කර ගැනීම මෙතෙක් ඉටු කරගත නොහැකිවීමෙන් ඵලදායී ක්‍රියාකාරිත්වයට බාධා පැමිණීම.

vi. පොදු අධිකාරීන් හා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව සම්බන්ධකර ජාලගතකිරීම අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් සිදුකිරීම.

vii. මහජන සම්බන්ධතාවය නිරතුරුව සිදුකිරීමට අවශ්‍ය පහසුකම් සහිත ඒකකයක් පිහිටුවීම.

viii. අන්තර්ජාතික මට්ටමේ මාධ්‍ය වෘත්තිකයන් බිහි කිරීම.

ix. රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශය සමඟ විශිෂ්ඨ ගුණාත්මක මාධ්‍ය සංස්කෘතියක් බිහි කිරීම.

x. නව මාධ්‍ය අනිසි ලෙස යොදා ගැනීම වලකා මාධ්‍ය සාක්ෂරතාවය මඟින් මාධ්‍ය හරහා සිදුවන හිංසනයන් හා අපචාර අවම කිරීම.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

කාණ්ඩය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ	24	14	10
තෘතීයික	05	01	04
ද්විතියික	97	72	25
ප්‍රාථමික	31	23	08
එකතුව	157	110	46

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

ශ්‍රම බලකායට හිඟයක් ඇති විට, සෑම සේවකයෙකුටම පැවරෙන අතිරේක රාජකාරි කටයුතු ප්‍රමාණය නිසි වේලාවට අවසන් කිරීම සඳහා මානසික ආතතියකින් සහ තෘප්තිමත්භාවයකින් තොරව කටයුතු කිරීමට සිදුවේ. එය කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය පහළ හෙලන අතරම සමස්තයක් ලෙස ආයතනයේ කාර්ය සාධනය අවම කරයි. ආයතනයේ නියමිත රාජකාරි ඉටුකිරීමේදී ප්‍රශස්ත මට්ටමින් රාජකාරි සම්පූර්ණ කිරීමට බාධාවන් ඇති වේ.

6.3 මානව සම්පත් සංවර්ධනය						
පාඨමාලා/ පුහුණු වැඩසටහනෙහි නම	පුහුණු කරන ලද කාර්ය මණ්ඩලය	වැඩසටහන් කාලය	මුළු ආයෝජනය (රු.)		වැඩසටහනෙහි ස්වභාවය (විදෙස් / දේශීය)	සාක්ෂාත් කරගත් ප්‍රතිඵල/දැනුම
			දේශීය	විදෙස්		
ලේකම් පරිවය		දින 04	50,000.00		දේශීය	ලේකම් පරිවය පිළිබඳව වෘත්තීය දැනුමක් ලබා ගැනීම සහ ඊට අදාළ කුසලතා වර්ධනය කර ගැනීම
පරිගණක දෘඩාංග හා ජාලකරණය	02	මාස 06	83,200.00		දේශීය	පරිගණක අලුත්වැඩියා කිරීම සඳහා 'පරිගණක දෘඩාංග' පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම
කාර්යාල ක්‍රම	50	දින 04	3,000.00		දේශීය	කාර්යක්ෂමතා කඩඉම් විභාගය මූලික කරගෙන සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සේවා නිලධාරීන් පුහුණු කිරීම
වැටුප් සැකසීම පිළිබඳ පුහුණු පාඨමාලාව	127	දින 01	81,782.00		දේශීය	වැටුප් සකස් කිරීම පිළිබඳව (Payroll Training) දැනුවත් කිරීම
මූලික ප්‍රසම්පාදන ක්‍රියාවලිය	35	දින 10	13,720.00		දේශීය	රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් මූලික අවබෝධයක් ලබා දීම
රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	3	දින 01	75,000.00		දේශීය	ආයතනික ප්‍රසම්පාදන කටයුතු කාර්යක්ෂමව හා සඵලදායිව පවත්වාගෙන යාම සහ සේවාවේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම
රියදුරන් සඳහා පුහුණුව	10	දින 01	15,720.00		දේශීය	රියදුරු සේවාවේ වගකීම, කාර්යභාරය හා ආචාරධර්ම පිළිබඳව රියදුරන් දැනුවත් කිරීම

ගිණුම්කරණ පාඨමාලාව	2	දින 01	196,000.00		දේශීය	ගිණුම්කරණයට අදාළ රාජකාරී කටයුතු ගුණාත්මකභාවයෙන් ඉටු කිරීම
Excel පිළිබඳ වැඩමුළුව	4	දින 01	66,000.00		දේශීය	Advanced Excel පිළිබඳව දැනුම ලබාදීම.
උප එකතුව	**235**		**584,422.00**			
පාඨමාලා/ පුහුණු වැඩසටහනෙහි නම	**පුහුණු කරන ලද කාර්ය මණ්ඩලය**	**වැඩසටහන් කාලය**	**මුළු ආයෝජනය (රු.)**		**වැඩසටහනෙහි ස්වභාවය (විදෙස් / දේශීය)**	**සාක්ෂාත් කරගත් ප්‍රතිඵල/දැනුම**
			දේශීය	දේශීය		
Seminar for Young Diplomats from Sri Lanka	01	සති 02		142,991.01	විදෙස්	ශ්‍රී ලංකාව හා චීනය අතර මිත්‍ර සම්බන්ධතාවය වර්ධනය කර ගැනීම සහ චීන සංවර්ධන ප්‍රතිපත්ති පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම
Seminar on New Media Platform Operation and Management in Belt and Road (BRI) Countries	02	සති 02		286,155.26	විදෙස්	චීන ප්‍රවෘත්ති හා මාධ්‍ය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීම හා නව මාධ්‍ය වේදිකාවන් භාවිතය තුලින් චීනය සිදුකර ඇති මාධ්‍ය සංවර්ධනය පිළිබඳ අවබෝධය
Seminar on Press Officers and Journalists of Belt and Road (BRI) Countries	02	සති 02		229,522.00	විදෙස්	චීනය හා සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර මාධ්‍ය සම්බන්ධ දැනුම දියුණු කිරීම හා චීන මාධ්‍ය තුළ ජනමාධ්‍යවේදීන්ගේ භූමිකාව පිළිබඳ අවබෝධය
KOICA Invitational Fellowship Training Programme, Artifical Intelligence	04	සති 02		434,098.00	විදෙස්	ඩිජිටල් පරිවර්තනය හා කෘතිම බුද්ධිය පිළිබඳ ප්‍රවනතා සහ කෘතිම පුවත්පත් කලාව සඳහා වන ප්‍රතිපත්ති තේරුම් ගැනීමටත්, ශ්‍රී ලංකා පුවත්පත් කලාවේ තාක්ෂණයන් උපයෝගී කර ගැනීම සඳහා දියුණු ඩිජිටල් සහ කෘතිම බුද්ධි තාක්ෂණයන්හි අත්දැකීම් බෙදා ගැනීමටත්,

						ශ්‍රී ලංකාවේ පුවත්පත් කලාවට දියුණු ඩිජිටල් සහ කෘතිම බුද්ධි තාක්ෂණයන් යොදා ගැනීම අරමුණු කර ගෙන ඇත.
Third Mid-Carrier Training Programme for Island Service Officers of Sri Lanka under the Indian Technical & Economic Co – Operation 2024/2025 – (ITEC)	01	සති 02		116,655.00	විදෙස්	යහපත් පාලනයක් සාක්ෂාත් කර ගැනීම සඳහා ඵලදායී රාජ්‍ය ප්‍රතිපත්තියක් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දැනුම සහ කුසලතා ලබා ගැනීමටත් එහි සහභාගීවන්නන්ට හැකියාව ලබාදීම සහ ඔවුන්ගේ පරිපාලන රාජකාරි කටයුතු සාර්ථකව ඉටු කිරීම.
i) UPU round table on remuneration – 23 & 24 September 2024 ii) UPU regional Strategy Conference for the Asia Pacific Region – Ulaanbaatar Mongolia – 25 &26 September 2024	01	සති 02		142,991.01	විදෙස්	කලාපීය අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් අවබෝධාත්මක, මානව කරුණු ගොනු කල සහ සියල්ල අන්තර්ගත UPU උපායමාර්ග දියත් කිරීම සම්බන්ධව සක්‍රීය දායකත්වය ලබා දීම
උප එකතුව	**11**	-	-	**1,336,757.02**	-	
එකතුව	-	-	-	**1921179.02**	-	

6.4 ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන්වල දායකත්වය

නිලධාරීන් පුහුණු පාඨමාලාවන්ට යොමු කිරීමේ අරමුණ නම් කාර්යාලීය වැඩකටයුතු නිසි අයුරින්, ක්‍රමවත්ව හා කාර්යක්ෂමව ඉටු කරවා ගැනීමට ඔවුන් පොළඹවා ගැනීමයි. පුහුණු පාඨමාලා, නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කරන අතර ඔවුන්ගේ හැකියා වර්ධනය වැඩිදියුණු කිරීමටද ඉවහල් වේ.

නිළධාරීන්ගේ දැනුම, කුසලතා, ආකල්ප හා නිර්මාණශීලීත්වය වර්ධනය කිරීම අපේක්ෂාවෙන් පුහුණු හා දේශීය හා විදේශීය වැඩසටහන් සඳහා නිළධාරීන් යොමුකිරීම සිදුවේ. මෙය අමාත්‍යාංශයේ කාර්යයන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවීමට මෙන්ම සේවක අභිප්‍රේරණයට හේතුවේ. මෙමගින් අමාත්‍යාංශයේ සමස්ථ කාර්යසාධනය ඉහළයාම සිදුවේ.

රාජ්‍ය අංශයට නවක පත්වීම් ලැබ අමාත්‍යාංශයට අනුයුක්ත කරන ලද නිලධාරීන් අනිවාර්ය පුහුණු පාඨමාලාවලටද යොමු කරන අතර මෙමගින් ඔවුන් රැකියාවට වඩා හොඳින් අනුගත වේ. තවද මෙම පුහුණු පාඨමාලා තුළින් නිලධාරීන්ට රාජකාරී පරිසරයේ ඒකාකාරී බවින් මිදීමට හා නව දැනුමින් සන්නද්ධ වීමට අවස්ථාව ලැබේ.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ.	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ.	-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ.	-	-
1.6	වෙනත්	අදාළ නොවේ.	-	-
2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	-	-
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.	-	-
2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	-	-

2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA –N 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	-	-
03	මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම.	අනුකූල වේ.	-	-
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ.	-	-
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම.	අනුකූල වේ.	-	-
3.4	2014.05.11 දිනැති 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ.	-	-
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD)	අනුකූල වේ.	-	-
4.5	නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.	-	-
5	විගණන විමසුම්			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනටල සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ.	-	-

6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ.134 (2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම.	අනුකූල වේ.	-	-
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-
7	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුවල අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ.	-	-
8	වත්කම් කළමනාකරණය			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ.	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට	අනුකූල නොවේ.	සේවක හිඟය.	සේවක කළමණාකරණය

	විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.			සඳහා පියවර ගෙන ඇත.
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම.	අනුකූල නොවේ.	සේවක හිඟය.	සේවක කළමණාකරණය සඳහා පියවර ගෙන ඇත.
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම.	අනුකූල වේ.	-	-
9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.	අනුකූල වේ.		-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව	අනුකූල වේ.	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම් නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ.	-	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ.	-	-
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අදාල නොවේ.	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම	අනුකූල වේ.	-	-

	ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල්කර තිබීම.			
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ.	-	-
11.2	මු.රෙ.94 (1) ප්‍රකාරවල සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ.	-	-
12	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ.	-	-
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ.	-	-
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ.	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	-	-
14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ.	-	-
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාරිය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ.	-	-
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ.	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ.	-	-

15	ආදායම් ගිණුම			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ.	-	-
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ.	-	-
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම.	අනුකූල වේ.	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ.	-	-
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තාල කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-
17	මහජනයා වෙත තොරතුරු ලබා දීම			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ.	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතරල වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ.	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-

18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම.	අනුකූල වේ.	-	-
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ.	-	-
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ.	-	-
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ.	-	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ.	-	-
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීමල ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීමල නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ.	-	-
20	විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල නොවේ.	-	නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගෙන ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. }සිඒඑම්/ඒ/එමඑම්/එෆ්ඒ/2024/15 ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date }2025 මැයි 29 දින

පෞද්ධ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
වෙළාව
29 MAY 2025
මුදල් අංශය
ජනමාධ්‍ය
කොළඹ 05.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
ජනමාධ්‍ය අමාත්‍යාංශය

ශීර්ෂය 105 - ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 105 - ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේ දී නිකුත් නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ජනමාධ්‍ය අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ජනමාධ්‍ය අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර්16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

අවුරුදු 2ත් 15ත් අතර කාල පරාසයක් ඇතුලත අයිතිය ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පැවරී ඇති වාහන 26ක වටිනාකම වන රු. 385,150,000 අගය (2024 වර්ෂයේ රක්ෂණය කිරීමේ දී ලබා ගත් තක්සේරු වාර්තා අනුව) මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් එම වටිනාකමින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
ඇප ලේඛනය	මුදල් රෙගුලාසි 891	පවත්වා නොතිබුණි.
භාණ්ඩ පාඩු ලේඛනය	මුදල් රෙගුලාසි 110	යාවත්කාලීන කර නොතිබුණි
බැරකම් පිළිබඳ ලේඛනය	මුදල් රෙගුලාසි 447	පවත්වා නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

පෞද්ගලික ආයතන දෙකකින් අය විය යුතු රු.මිලියන 20 ක මුදල වර්ෂ 12 -18 කාලයක සිට හිඟව පැවති අතර ඒවා අය කර ගැනීම සඳහා විධිමත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

3.2 වියදම් කළමනාකරණය

3.2.1 ජනමාධ්‍ය අමාත්‍යාංශය සඳහා රු.432,500,000 ක මූලධන ශුද්ධ මුදල් ප්‍රතිපාදනයක් පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු. 185,723,029ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව මූලධන වියදමෙන් සියයට 57ක් ඉතිරි වී තිබුණි.

3.2.2 ප්‍රතිපාදන මාරු කිරීම්

මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව, තම අමාත්‍යාංශයට අදාළ කෙටුම්පත් ඇස්තමේන්තු, මුදල් රෙගුලාසිවලට අනුකූලව පිළියෙල කරන බවට වගබලා ගැනීම ගණන්දීමේ නිලධාරියාගේ

වගකීම වේ. සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා තිබූ සමස්ත පුනරාවර්තන වැය විෂයයන් 25 කින් පුනරාවර්තන වැය විෂයයන් 04 කට සලසා තිබුණු රු. 10,810,000 ක ප්‍රතිපාදන වෙනත් පුනරාවර්තන වැය විෂයයන් 06ක් වෙත මාරු කර තිබූ බැවින් මූදල් රෙගුලාසිවල අවශ්‍යතා සපුරාලන පරිදි කටයුතු කරමින් තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

3.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

2025 වර්ෂයට අදළ වැය ලෙජරයේ පෙර වර්ෂයේ බැදීම් හා බැරකම් ලෙස වැය විෂයය අංක 111-1-27-1002 යටතේ දක්වා ඇති අතිකාල හා නිවාඩු දින දීමනා වල එකතුව රු. 375,689ක් වූව ද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර තිබූ SA 92 ආකෘතිය අනුව බැරකම් 148,699ක් වූයෙන් රු. 226,990ක වෙනසක් නිරීක්ෂණය විය.

3.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති රීති රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
i	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි 88	රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුව ඇප තැබිය යුතු අමාත්‍යාංශයේ නිලධාරීන් 22ක් ඒ අනුව කටයුතු කර නොතිබුණි
ii	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 හා 2009 ජුනි 17 දිනැති අංක 09/2009(i) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ	අමාත්‍ය කාර්ය මණ්ඩලය තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම සනාථ කළ යුතු බව සඳහන්වුව ද අමාත්‍යවරයාගේ කාර්යමණ්ඩලය නිලධාරීන් 05 දෙනෙක් හා රාජ්‍ය අමාත්‍ය- වරයාගේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 05 දෙනෙකුගේ, 2024 ජනවාරි 01 දින සිට 2024 සැප්තැම්බර් 30 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ පැමිණීම සහ පිටවීම සටහන් කිරීම සඳහා ලේඛනයක්

පවත්වා ගෙන ගොස් නොතිබුණි. පැමිණිම සනාථ කරන ලේඛන නොමැතිව මෙම නිලධාරීන් වෙනුවෙන් වැටුප්, ප්‍රවාහන දීමනා ඉන්ධන සඳහා රු13,941,368 අමාත්‍යාංශයෙන් දරා තිබුණි.

3.6 අත්තිකාරම්

සේවය හැර ගොස් ඇති නිලධාරියකුගෙන් අය විය යුතු වර්ෂ 01 ඉක්මවූ රු.148,502 ක ණය ශේෂය 2025 පෙබරවාරි 28 දින වන විටත් අය කරගෙන නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

අ) පදනම් ආයතනයේ ශ්‍රවණාගාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් 2024 වර්ෂයේ දී රුපියල් මිලියන 10.75ක ප්‍රතිපාදනයක් සලසා තිබූ අතර 2024 දෙසැම්බර් 31 දිනට එම කටයුතුවල ප්‍රගතිය සියයට 100ක් ලෙස දක්වා තිබුණි. නමුත් එහි ඉදිකිරීම් කටයුතු ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට පවරා තිබුණ ද දෙපාර්තමේන්තුව මෙම කාර්ය ඉටු කිරීම සඳහා බාහිර පාර්ශව වෙත ආරාධනා කර තිබුණේ 2025 පෙබරවාරි 24 දින සිටය.

ආ) පදනම් ආයතනයේ WiFi පහසුකම් සැපයීම හා ස්ථාපනය කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 6.8 සඳහා වන ව්‍යාපෘතියේ ප්‍රගතිය ද 2024 දෙසැම්බර් 31 දිනට සියයට 100ක් ලෙස දක්වා ඇතත් එදින වන විටත් මෙම ව්‍යාපෘතිය ආරම්භකර නොතිබුණි.

4.2 ප්‍රසම්පාදනයන්

4.2.1 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගත කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළයුතු අතර වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කළ යුතු වුවත් අමාත්‍යාංශය එසේ සිදු කර නොතිබුණි.

4.2.2 අමාත්‍යාංශයේ ආරක්ෂක සේවා සපයන ලද සමාගමේ ගිවිසුම් කාලය 2023 අගෝස්තු 31 දින අවසන්ව තිබූ අතර නව ආයතනයක් තෝරා නොගෙන එම සමාගමටම රු. 368,000 මුදලක් දරමින් 2024 අප්‍රේල් 01 දක්වා සේවය ලබා ගෙන තිබුණි. කෙසේ වෙතත් 2024 අප්‍රේල් 01 දින සිට වෙනත් සමාගමක් තෝරා ගෙන තිබූ අතර ගිවිසුම් අනුව එම ආයතනයට මසකට උපරිම රු. 276,149 මුදලක් ගෙවීමට ගිවිසුම් ගත වී තිබුණි. මේ අනුව නියමිත කාලය තුළ විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මගින් ආයතනය තෝරා නොගැනීම මත අමාත්‍යාංශය මසකට රු.91,851 බැගින් මාස 06ක කාලය සඳහා රු.551,106 අමතර වියදමක් දැරීමට සිදු වී

නිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

4.3.1 අංක 32-8985 දරන පෙජරෝ රථය 2022 ජනවාරි 26 දින ජනමාධ්‍ය අමාත්‍යාංශයට පවරා ගැනීමට කටයුතු කර තිබූ අතර අදාළ වාහනයේ පළමු අයිතිකරු විසින් ගෙවීමට තිබූ රු.180,000ක හිඟ බලපත්‍ර ගාස්තු වටිනාකමක් හේතුවෙන් ආදායම් බලපත්‍ර ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි.ඒ හේතුවෙන් අදාළ වාහනය පවරාගත් දින සිටම ධාවනයට යොදා නොගෙන නිෂ්කාර්යය පවතින බව නිරීක්ෂණය විය.

4.3.2 අමාත්‍යාංශයේ ප්‍රවාහන කටයුතු සඳහා අමාත්‍යාංශයට අයිතිය පැවරුණු හා නොපැවරුණු වාහන ඇතුළුව වාහන 29ක් පමණ තිබුණද 2024 වර්ෂය තුලදී වාහන 19ක් භාවිතාකර තිබුණි. එසේ තිබියදී කල්බදු ක්‍රමයට වාහන 02ක් රුපියල් මිලියන 33කට වර්ෂ 5ක කාල පරිච්ඡේදයක් සඳහා මෙහෙයුම් කල්බදු ක්‍රමය මත ලබා ගෙන තිබූ අතර මෙම වාහන 02 වෙනුවෙන් 2024 වර්ෂයේ පමණක් රු. 8,227,326 වියදමක් දරා තිබුණි.

4.3.3 අමාත්‍යාංශයට විධිමත් ලෙස අයිතිය පවරා නොගත් හා තක්සේරු නොකළ වාහනයක් රු.2,500,000කට අපහරණය කිරීමට පියවර ගෙන තිබුණි.

4.4 අනාර්ථික ගනුදෙනු

4.4.1 ප්‍රසිද්ධ රැහුම් පාලක මණ්ඩලය 2015 වර්ෂයේදී රු.6,581,432 ක වටිනාකමකට මිලදී ගන්නා ලද ඩි.සී.පී. යන්ත්‍රය 2019 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 තෙක් ක්‍රියාත්මකව නොපැවතීම නිසා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ඉදිකර තිබූ රු.56,500,000ක වටිනාකමින් යුතු සිනමාශාලාව මේ දක්වා ක්‍රියාකාරීත්වයට පත් කිරීමට නොහැකිව තිබුණි. මේ අනුව මෙම යන්ත්‍රය ක්‍රියාකාරීත්වයට පත් නොකිරීම මඟින් මණ්ඩලයට ලැබිය යුතුව තිබූ රු.14,765,000ක ආදායමක් අහිමි වී තිබුණි.

4.4.2 වටිනාකම රු 14,000,000 වූ ප්‍රවාහන සිවිල් ගුවන් සේවා ආයතනයට අයත් අංක KY – 3328 දරණ ටියානා නිසාන් රථය වෙනුවෙන් ජනමාධ්‍ය අමාත්‍යාංශය 2024 වර්ෂය තුළ දී රු.3,042,848ක අලුත්වැඩියා වියදමක් දරා තිබූ අතර මෙය එම වර්ෂය තුළ අමාත්‍යාංශයේ සමස්ත අලුත්වැඩියා වියදමින් සියයට 54 පමණ නියෝජනය වන බව නිරීක්ෂණය විය. මෙවැනි විශාල වටිනාකමකින් යුත් රථ වාහන භාවිතය හා නඩත්තුව වෙනුවෙන් දරණ වියදම 2024 ජනවාරි 10 දිනැති ජාතික අය වැය චක්‍රලේඛ අංක 01/2024 හි විධිවිධාන වලට අනුකූල නොවන බව නිරීක්ෂණය විය.

4.4.3 භෞමික රූපවාහිනී විකාශන අංකිතකරණ ව්‍යාපෘතිය වෙනුවෙන් 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා පිළිවෙලින් වැය විෂයය අංක 105-02-04-08-2509-12 සහ 105-02-04-08-2509-17 යටතේ ද 2025 වර්ෂයේ දී වැය විෂයය අංක 111-02-28-004-2509-17 යටතේ ද ,

විගණිත දින වන 2025 අප්‍රේල් 30 දින දක්වා රු.මිලියන 32.7 පමණ වියදමක් දරා තිබුණ අතර මෙම වියදමින් සියයට 99 වැඩි කොටසක් වැටුප් හා වේතන වෙනුවෙන් දරා තිබුණ ද අපේක්ෂිත පරිදි කාර්යභාරයන් ඉටු කර නොතිබුණි.

4.5 කළමනාකරණ දුර්වලතා

2023 අංක 34 දරණ විසර්ජන පනත මගින් ශීර්ෂ අංක 105 ජනමාධ්‍ය අමාත්‍යාශය යටතේ ප්‍රතිපාදනය කරන ලද රු.5,643,580ක රථවාහන අළුත්වැඩියා වියදමෙන් රු.3,042,848ක් සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට අයත් රථවාහනය අළුත්වැඩියා කිරීම සඳහා දරා තිබුණි.

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
சுகாதார மற்றும் வெகுசன ஊடக அமைச்சு
Ministry of Health and Mass Media

ජනමාධ්‍ය අංශය
வெகுசன ஊடகப் பிரிவு
Mass Media Division

අංක. 163, ඇසිඩිසි මැදුර, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05
இல. 163, அசிதிசி மெதுர, கிருளப்பனை மாவத்தை, பொல்ஹேன்கொடை, கொழும்பு 05
No. 163, Asi Disi Medura, Kirulapone Mawatha, Polhengoda, Colombo 05

දුරකථන / தொலைபேசி / Telephone
011-2513 459, 011-2512 321, 011-2513 498